# 2022.04.12 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව
# මීගහකිවුල ප්‍රාදේශිය සභාව

**පැමිණීම.**

01.ගරු සභාපති - එස්.එම්.එල්.එච්.ජයවර්ධන මැතිතුමා
02.ගරු උප සභාපති - ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා
03.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම්.රංගන මධුමාල් සමරකෝන් මැතිතුමා
04.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.පී.කපිල ආනන්ද රාජපක්ෂ මැතිතුමා
05.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - සුමතිපාල උඩලකුඹුර මැතිතුමා
06.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.එම්.ශ්‍රියාලතා මැතිණිය
07.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා
08.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.ශ්‍රියාණි සාමාවතී මැතිණිය
09.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.රත්නතිස්ස මැතිතුමා
10.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.පී. බාලසුන්දරම් මැතිතුමා
11.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා
12.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එම්.නිශාදි ශිරන්තිකා මැතිණිය
13.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  - එන්.එන්.එම්.නන්දන සම්පත් උදය කුමාර මැතිතුමා
14.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.චමින්ද ප්‍රදිප් මැතිතුමා
15.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.මංජුල දිසානායක මැතිතුමා
16.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.පත්මා කුමාරි මැතිණිය
17.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එම්.නාමල් රත්නායක මැතිතුමා
18.සභා ලේකම් - ඩී.එම්.කේ.ඩී.දිසානායක මෙය
19.විෂය නිලධාරි - ආර්.එම්.නිල්මිණි සකුන්තලා මිය

**සභාව ආරම්භ කිරිම.**

පෙ.ව.10.00ට ගරු සභාපතිතුමා මූලාසනය ගනිමින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා,ගරු මන්ත්‍රීතුමන්ලාත්,සභා ලේකම්තුමිය හා විෂය නිලධාරී පිළිගනිමින් සභා රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී. මූලාසනය විසින් එදින න්‍යාය පත්‍රාණුකූලව මුලින්ම පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීමට සභාවට ඉදිරිපත් කරන ලදී.

**(අ) පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කර ගැනීම.**

මෙහිදී මූලාසනය සභාව අමතමින් ගරු මන්ත්‍රීවරුනි, පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව කියෙව්වා සේ සළකා සභා යෝජනා ස්ථිරත්වයෙන් සම්මත කර සභා වාර්තාවල සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙස මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමනි,පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තා බැවින් සභා සම්මත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.රත්නතිස්ස මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුමතිපාල උඩලකුඹුර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

මූලාසනය සභාව අමතමින් පසුගිය සභා වාර්තාවේ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙස මම මේ ගරු සභාවට දන්වා සිටිනවා.

**මූලාසනය සභාව අමතමින් පසුගිය සභා වාර්තවේ සංශෝධන කිසිවක් නොමැති බැවින් පසුගිය මහ සභා වාර්තාව සම්මත කිරීම සඳහා ගරු සභාපතිතුමා විසින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සභාවේ සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව  ඒකමතිකව සභා සම්මත වූ බව සභාවට දන්වන ලදී.**

ගරු සභාපතිතුමා සභාව අමතා න්‍යාය පත්‍රාණුකූලව විශේෂ නිවේදන ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

(ආ) ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

ගරු සභාපතිතුමා සභාව අමතමින් මෙම සභා වාරය සඳහා විශේෂ නිවේදන කිසිවක් ලැබී නොමැති බව මා මේ ගරු සභාවට ප්‍රකාශ කරනවා.

ගරු සභාපතිතුමා සභාව අමතා න්‍යාය පත්‍රාණුකූලව සංදේශ,පැමිණිලි,පෙත්සම් හා ආයාචනා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

(ඇ) සංදේශ, පෙත්සම් පැමිණිලි සහ ආයාචනා සභා ගත කිරීම.

ගරු සභාපතිතුමා සභාව අමතමින් මෙම සභා වාරය සඳහා සංදේශ,පැමිණිලි,පෙත්සම් හා ආයාචනා කිසිවක් ලැබී නොමැති බව මා මේ ගරු සභාවට ප්‍රකාශ කරනවා.

මීළඟට ගරු සභාපතිතුමා සභාව අමතා න්‍යාය පත්‍රාණුකූලව කල් දෙනු ලැබූ ප්‍රශ්න ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

(ඈ) කල්දෙනු ලැබූ ප්‍රශ්න

ගරු සභාපතිතුමා විසින් පළමු කල් දෙනු ලැබූ ප්‍රශ්නය සභාව හමුවේ තබන ලදී.

1. ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් පසුගිය සභා වාරයේදී හදිසි යෝජනා අංක 02 යටතේ ඉදිරිපත් කරන ලද මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් මීගහකිවුල බස් නැවතුම්පලේ ඉහළ මහලේ කඩකාමර 04 පාටීෂන් කරන්නේ නැතුව බ්ලොක් ගලෙන් තැනීම සඳහා TO මහත්තයාගෙන් ඇස්තමේන්තුවක් ගෙන මෙම සභා වාරයට ඉදිරිපත් කරන ලෙස පසු ගිය සභාව තීරණය කරන ලදී. ඒ අනුව ඇස්තමේන්තුවට අනුව මුදල රු:195,000.00 සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා සභා ගත කරන ලදී.

**මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් මීගහකිවුල බස් නැවතුම්පලේ ඉහළ මහලේ කඩකාමර 04 පාටීෂන් කරන්නේ නැතුව බ්ලොක් ගලෙන් තැනීම සඳහා TO මහත්තයාගෙන් ඇස්තමේන්තුවක් ගෙන මෙම සභා වාරයට ඉදිරිපත් කරන ලෙස පසු ගිය සභාව තීරණය කරන ලදී. ඒ අනුව ඇස්තමේන්තුවට අනුව මුදල රු:195,000.00 සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා ස්ථිර කලේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදි.**

මීළගට මූලාසන සභාව අමතමින් කල්දෙනු ලැබූ ප්‍රශ්න අංක 02 ඉදිරිපත් කරන ලදී.

2. ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් 2020 වර්ෂය අවසානයේදී සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයට ඉදිරිපත් නොවූ පොත් සම්බන්ධයෙන් පහත කරුණ ඉදිරිපත් කරමි.

2020 භාණ්ඩ සමීක්ෂණයට ඉදිරිපත් නොවූ මුළු පොත් ගණන - 44

1) 2020 සමීක්ෂණය සිදු කරන විටබැහැරට දී ඇති සංඛ්‍යාව - 20
2) කළුගහකඳුර පුස්තකාලයට ලබා දී ඇති පොත් ගණන - 02
3) 2018/2019 සමීක්ෂණයට ඉදිරිපත් නොවී අස්ථාන ගත වූ පොත් සඳහා මුදල් ගෙවා ඇති පොත් ගණන - 11
4) 2018 සිට නැති මුදල් අය කර ගැනීමට ඇති පොත් ගණන - 01

5) භාණ්ඩ සමීක්ෂණයෙන් නොමැති බව සඳහන් නමුත් පුස්තකාලයේ තිබෙන පොත් ගණන - 06
6) 2020 සමීක්ෂණය අනුව අස්ථාන ගත වී ඇති පොත් ගණන - 04

**44**

ඒ අනුව , අනු අංක 06 යටතේ සඳහන් 2020 ට අදාළව සිදු කරන ලද සමීක්ෂණය අනුව ගත වී ඇති පොත් 04ක මුදල් චක්‍රලේඛනයේ අනු අංක 2004/පුස/1(2016 සංශෝධිත) අනුව කපා හැරීමට සහා අනුමැතිය ලබා ගැනීම සඳහා සභා ගත කරන ලදී.

**ඒ අනුව , ඉහත සඳහන් අනු අංක 06 යටතේ සඳහන් 2020 ට අදාළව සිදු කරන ලද සමීක්ෂණය අනුව ගත වී ඇති පොත් 04ක මුදල් චක්‍රලේඛනයේ අනු අංක 2004/පුස/1(2016 සංශෝධිත) අනුව කපා හැරීමට සහා අනුමැතිය ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා සුමතිපාල උඩලකුඹුර මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.නාමල් රත්නායක මැතිතුමා ස්ථිර කලේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව මත එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින් කල්දෙනු ලැබූ ප්‍රශ්න අංක 03 ඉදිරිපත් කරන ලදී.

3. ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් පසුගිය සභා වරයේදී හදිසි යෝජනා අංක 07 යටතේ ඉදිරිපත් කරන ලද මීගහකිවුල ප්‍රාදේශීය සභා දෛනික වැටුප් ලබමින් සේවයට යොදවා ඇති සේවකයින් වෙත උත්සව අත්තිකාරම් ලබා දීම සම්බන්ධයෙන් පහත කරුණු ඉදිරිපත් කරමි.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/2015 හා ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ජේදයේ 13 වන වගන්තිය යටතේ මාස 03කට නොඅඩු සේවා කාලයක් ඇති සේවකයින් හා තවදුරටත් ඉදිරියේදී එම සේවකයින් සේවයේ යොදවා ගැනීමේ අපේක්ෂාව අනුව උත්සව අත්තිකාරම් ලබා දීමේ හැකියාව ඇති බැවින් මාස 03කට වඩා සේවා කාලයක් සම්පූර්ණ කර ඇති දෛනික වැටුප් ලබමින් සේවයට යොදවා ඇති සේවකයින් සඳහා උත්සව අත්තිකාරම් ගෙවීමට සහා අනුමැතිය ලබා ගැනීම සඳහා සභා ගත කරන ලදී.

**ඒ අනුව ඉහත සඳහන් රාජ්‍ය චක්‍රලේඛනයට අනුව මීගහකිවුල ප්‍රාදේශීය සභා දෛනික වැටුප් ලබමින් සේවයට යොදවා ඇති සේවකයින් වෙත උත්සව අත්තිකාරම් ලබා දීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බව බව ගරු ප්‍රාදේශීය සභා සුමතිපාල උඩලකුඹුර මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.නාමල් රත්නායක මැතිතුමා ස්ථිර කලේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව මත එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින් කල්දෙනු ලැබූ ප්‍රශ්න අංක 04 ඉදිරිපත් කරන ලදී.

4. ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් පසුගිය සභා වාරයේදී හදිසි අංක 08 යටතේ ඉදිරිපත් කරන ලද මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් UUPF-5485 නිළ කැබ් රථය සඳහා 2022 පෙබරවාරි මස ලීටර් 90 අමතර ඉන්ධන අනුමැතියට ලබා ගැනිම සඳහා සභා ගත කරන ලදී.

විදුලිය හා ඉන්ධන අරපිරිමැස්මෙන් භාවිත කිරිමට අදාළව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 04/2022 2022.03.08 දින නිකුත් කර ඇත. තවද එම චක්‍රලේඛය ඌව පළාතට ඌව පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත අනුගත කර ඇත.

මීළගට මූලාසන සභාව අමතමින් කල්දෙනු ලැබූ ප්‍රශ්න අංක 05 ඉදිරිපත් කරන ලදී.

5. ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් මීගහකිවුල ප්‍රාදේශීය සභාව මඟින් සකස් කරන ලද මීගහකිවුල ජල පොම්පාගාරය අසල ඉදිකර ඇති නළ ළිඳ සහ මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ඉදිකර ඇති නළ ළිං සඳහා ජල මෝටර් හා ජල මීටර් 100ක් කැඳවන ලද මිල ගණන් වලට අනුව අවම මිල ගණන් යටතේ මිලදී ගැනීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදී.

ඒ අනුව, මෝටර් ලබා ගැනීම සඳහා පමණක් කැඳවූ මිල ගණන් අනුව රු:600,000.00 කට ආසන්න ප්‍රමාණයක් වැය වනු ඇත. ඒ සඳහා එකවර සභාව වෙතින් වියදම් දැරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන ප්‍රමාණයක් නොමැත. එබැවින් දේශීය ණය සංවර්ධන අරමුදලින් ණය මුදලක් හෝ ප්‍රතිපාදන සලසා ගත් විගස එක් මෝටරයක් හෝ ගැනීමට කඩිනමින් කටයුතු කරනු ඇත.

**ඉදිරියේදී මීගහකිවුල නගරය සඳහා වතුර ප්‍රමාණය අඩු වෙන බැවින් ඒ සඳහා එක ජල මෝටරයක් සභා අරමුදලින් වියදම් දරා ඉදිරි ජල මීටර් සහ ජල මෝටරය දේශීය ණය සජවර්ධන අරමුදලින් හෝ ප්‍රතිපාදන සලසා ගත් විගස ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා එස්.එම්.රංගන මධුමාල් සමරකෝන් මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි සාමාවතී මැතිණිය ස්ථිර කලේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව මත එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදි.**

මීළගට මූලාසන සභාව අමතමින් කල්දෙනු ලැබූ ප්‍රශ්න අංක 06 ඉදිරිපත් කරන ලදී.

6. ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා සභාව අමතමින් රු:75,000.00 යෝජනාව සම්බන්ධව තත්වය විමසන ලදී.

ඒ අනුව, මේ වනවිට මන්ත්‍රීවරුන් 06 දෙනෙකුගේ යෝජනා ගරු ආණ්ඩුකාරතුමා වෙත අනුමැතිය සඳහා යොමු වී ඇත. තවද පෙර වර්ෂයන් එනම් 2020 වර්ෂය යටතේ රු:100,000.00 ක ප්‍රතිපාදන යටතේ ද්‍රව්‍යාධාර ලබා දීම සම්බන්ධයෙන් මේ වන විට අනුමැතිය ලැබී ඇති නමුත් ඒ සඳහා ද්‍රව්‍යාධාර ලබා ගැනීමට අදාළ වෙළඳසැල් සඳහා ඇණවුම් යැවුවද මීල ගණන් කැඳවූ මිලට ද්‍රව්‍යාධාර ලබා දීමට නොහැකි බව දන්වා ඇණවුම් භාර ගැනීම ප්‍රතික්ෂේප කර එවා ඇත.

එබැවින් රු:75,000.00 යෝජනා සඳහාද මෙම ගැටළුව මතු වන බැවින් අනුමැතිය ලද පසු නැවත මිල ගණන් කැඳවා නියමිත අනුමත සීමාව තුළ ද්‍රව්‍යාධාර ලබා දීම සම්බන්ධයෙන් ගරු සභාවේ අනුමැතිය සඳහා සභා ගත කරන ලදී.

**ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලද පසු නැවත මිල ගණන් කැඳවා නියමිත අනුමත සීමාව තුළ ද්‍රව්‍යාධාර ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා එස්.එම්.රංගන මධුමාල් සමරකෝන් මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.නාමල් රත්නායක මැතිතුමා ස්ථිර කලේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව මත එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදි.**

මීළඟට ගරු සභාපතිතුමා සභාව අමතා න්‍යායපත්‍රාණුකූලව යථා පරිදි කල් දී ඇති යෝජනා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

ගරු සභාපතිතුමා සභාව අමතමින් මෙම සභා වාරය සඳහා යථා පරිදි කල් දී ඇති යෝජනා කිසිවක් ලැබී නොමැති බව මා මේ ගරු සභාවට ප්‍රකාශ කරනවා.

ගරු සභාපතිතුමා සභාව අමතා න්‍යාය පත්‍රාණුකූලව හදිසි යෝජනා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

**හදිසි යෝජනා**

මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 01 ඉදිරිපත් කරන ලදි.

01) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 16-E වටගොම්මන හා නාරගස්ගොම්මන ගම් කොටස්වල ජනතාව භාවිතා කරනු ලබන අක්කර භාගයක පමණ කුඩා ප්‍රමාණයකින් යුත් පොදු සුසාන භූමිය දැනට එක්තරා පුද්ගලයෙකු විසින් අනවසරයෙන් කටු කම්බි ගසා අල්ලා ගෙන වගා කටයුතු සිදු කරගෙන යන බවට ප්‍රදේශයේ ජනතාව විසින් මා වෙත දැනුවත් කිරීමෙන් අනතුරුව එහි ගිය මාහට ද එහි සත්‍යතාව නිරීක්ෂණ විය. වටගොම්මන හා නාරංගස්ගොම්මන වෙසෙන ජනතාවට ඇති එකම පොදු සුසාන භූමිය වන මෙම සුසාන භූමිය කාලයක් තිස්සේ විවිධ පුද්ගලයන් විසින් බලහත්කාරයෙන් අල්ලා ගන්නා බැවින් දැනටමත් සුසාන භූමියට අයත් බිම් ප්‍රමාණය අඩු වී ඇත.

එම නිසා මේ පිළිබඳ කඩිනමින් සොයා බලා සුසාන භූමිය බලහත්කාරයෙන් අල්ලාගෙන සිටින අයට එරෙහිව කටයුතු කොට සුසාන භූමියට අයත් ඉඩම් කොටස නිරවුල් කර මෙම ගැටලුව නිරාකරණය කරදෙන ලෙස ඉල්ලා ඇති ලිපිය සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදී.

**වටගොම්මන මරණාධාර සමිතියේ මුදලින් මැනීම් කටයුතු සිදු කර ගැනීමට හැකිද යන වග සමිතිය වෙත ලිපියක් යවන ලෙස සභාව විසින් තීරණට කරන ලදී.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදි.**

මීළගට මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 02 ඉදිරිපත් කරන ලදි.

02) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් UPPF-5485 නිළ කැබ් රථය සඳහා 2022 මාර්තු මස ලීටර් 136 අමතර ඉන්ධන අනුමැතිය ලබාගැනීම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදි.

**මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් UPPF-5485 නිළ කැබ් රථය සඳහා 2022 මාර්තු මස ලීටර් 136 අමතර ඉන්ධන අනුමැතිය ලබා දීම සුදුසු බව බව ගරු ප්‍රාදේශීය සභා එස්.එම්.රංගන මධුමාල් සමරකෝන් මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි සාමාවතී මැතිණිය ස්ථිර කලේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව මත එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදි.**

මීළගට මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 03 ඉදිරිපත් කරන ලදි.

03) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් මීගහකිවුල නව බස්නැවතුම්පෙළෙහි පහළ මහලේ කඩකාමර සඳහා ටෙන්ඩර් කැඳවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව සභාගත කරන ලදි.

**මීගහකිවුල නව බස්නැවතුම්පෙළෙහි පහළ මහලේ කඩකාමර සඳහා ටෙන්ඩර් කැඳවීම සඳහා සහා අනුමැතිය ලබා දීම සඳහා සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.නිශාදි ශිරන්තිකා මැතිණිය ස්ථිර කළේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව මත එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 04 ඉදිරිපත් කරන ලදි.

04) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් පී.එච්.කෞෂානි තිලෝකා, පහල ගෙදර, මීගහකිවුල යන අය විසින් 2021/04/12 වන දිනට පෙර දීමට නියමිත වූ Drafe wood (c2902) ඉංග්‍රීසි රචනා මාර්ගය (4666) යන පොත් සඳහා 2021/04/12 සිට 2022/03/31 දක්වා දින 353 කට දඩ මුදල වශයෙන් රු:3530/=ක මුදලක් ගෙවීමට ඇති බැවින්, ඒ වන විට රටේ පැවති කොරෝනා තත්වය හේතුවෙන් මෙම පොත් භාර දීමට නොහැකි වීම නිසා දඩ මුදල පිළිබඳ සලකා බලා සහනයක් ලබා දෙන ලෙස ඉල්ලා ඇති ලිපිය සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදී.

**පී.එච්.කෞෂානි තිලෝකා, පහල ගෙදර, මීගහකිවුල යන අය විසින් 2021/04/12 වන දිනට පෙර දීමට නියමිත වූ Drafe wood (c2902) ඉංග්‍රීසි රචනා මාර්ගය (4666) යන පොත් සඳහා 2021/04/12 සිට 2022/03/31 දක්වා දින 353 කට දඩ මුදල වශයෙන් රු:3530/=ක මුදල අය කර ගන්නා ලෙස සභාව විසින් තීරණය කරන ලදී.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වු බව ප්‍රකාශ කරන ලදී.**

මීළගට මූලාසන සභාව අමතමින් හදිසි යෝජනා අංක 05 ඉදිරිපත් කරන ලදි.

05) ගරු සභාපතිතුමා විසින් සභාව අමතමින් 2022/2023 වර්ෂය සඳහා මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු කිරිහල බදු දීම සම්බන්ධයෙන් 2022/04/05 වන දිනට ටෙන්ඩර් කැඳවන ලදී. ඒ අනුව ඒ සඳහා කිසිදු ටෙන්ඩර් අයදුම්පතක් ඉදිරිපත් නොවූ හෙයින් ටෙන්ඩර් මණ්ඩලය විසින් නැවත ටෙන්ඩර් කැඳවීමට තීරණය කරන ලදී. ඊට අදාල මිල ගණන් වෙනස් කර සැකසූ ප්‍රසම්පාදන දැන්වීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව සභාගත කරන ලදි.

**2022/2023 වර්ෂය සඳහා මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු කිරිහල බදු දීම සම්බන්ධයෙන් 2022/04/05 වන දිනට ටෙන්ඩර් කැඳවන ලදී. ඒ අනුව ඒ සඳහා කිසිදු ටෙන්ඩර් අයදුම්පතක් ඉදිරිපත් නොවූ හෙයින් ටෙන්ඩර් මණ්ඩලය විසින් නැවත ටෙන්ඩර් කැඳවීමට තීරණය කරන ලදී. ඊට අදාල මිල ගණන් වෙනස් කර සැකසූ ප්‍රසම්පාදන දැන්වීම සඳහා සහා අනුමැතිය ලබා දීම සඳහා සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමාල් සමරකෝන් මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.චමින්ද ප්‍රදිප් මැතිතුමා ස්ථිර කළේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව විමසා සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාව මත එම යෝජනාව ඒකමතිකව සහා සම්මත වූ බව ප්‍රකාශ කරන ලදි.**

මූලාසන සභාව අමතමින් මීළගට න්‍යායපත්‍රානුකූලව කාරක සහා වාර්තා සලකා බැලීම සම්බන්ධයෙන් 2022.04.06 වන දින මුදල් කමිටු වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි.

## **2022/04/06 දින මීගහකිවුල ප්‍රාදේශීය සභාවේදී පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව**

2022/04/06 වන දින පෙ.ව.10.00ට ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුමතිපාල උඩලකුඹුර මැතිතුමා,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.නිශාදි ශිරන්තිකා මැතිණිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා, ලේකම්තුමිය හා විෂය නිළධාරී පිළිගනිමින් මුදල් හා ප්‍රතිපත්ති කමිටුව ආරම්භ කරන ලදී.

මීළඟට න්‍යාය පත්‍රාණුකූලව ගරු සභාපතිතුමා විසින් 2022.03.08 දිනැති පසුගිය රැස්වීම් වාර්තාව ඉදිරිපත් කරන ලදී. පසුගිය රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා ස්ථිර කළේය.

න්‍යාය පත්‍රාණුකූලව දිනට නියමිත කරුණු සාකච්ඡාවට භාජනය කරන ලදී.

ගරු සභාපතිතුමා විසින් පළමු කරුණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.ඒ අනුව 2022 මාර්තු මස ආදායම් වියදම් හා ඉන්ධන වාර්තා කමිටුවේ නිර්දේශය සඳහා ඉදිරිපත් කළ අතර 2022 වර්ෂයේ මාර්තු මස ආදායම් වියදම් හා ඉන්ධන වාර්තා අනුමත කිරීම සඳහා නිර්දේශය ලබාදීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

මීගහකිවුල නව බස්නැවතුම්පල වෙත යාමට නිසි මාර්ගයක් ලෙස වැසිකිලිය අසලින් මාර්ගයකුත් විජේ වින්කලය අසල කඩවල් තුනක් අයින් කරලා එතැනින් මාර්ගයක් සකස් කිරීම සඳහා ප්‍රධාන ලේකම්තුමා මුදල් ලබා දෙන අතර ඒ සඳහා නිර්දේශය ලබා දීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

මීගහකිවුල නව බස්නැවතුම්පෙළෙහි පහළ මහලේ කඩකාමර සඳහා ටෙන්ඩර් කැඳවීම සඳහා නිර්දේශය ලබා දීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

පසුගිය මුදල් කමිටුවේදී නිර්දේශ කරනු ලැබූ UPPF 5485 නාවාරා කැබ් රථයේ ටර්බෝ පද්ධතිය අලුත් වැඩියා කිරීම සඳහා ඊට අදාල නොවන අමතර කොටසක් ඇතුළුව එම මුදල සඳහන් කර තිබූ අතර එම ෆැන් බෙල්ට් එක සඳහා රු:7,600.00ක මුදල සඳහා බිල්පත් පියවීම සඳහා නිර්දේශය ලබා දීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

මීගහකිවුල නව බස්නැවතුම්පොළෙහි අමතර වැඩ කටයුතු සිදු කිරීම සඳහා රු:195,000.00ක මුදල් වැය වන අතර ඒ සඳහා අවශ්‍ය නිර්දේශය ලබා දීම සුදුසු බව කමිටුව තීරණය කරන ලදී.

දිනට නියමිත කරුණු අවසන් බැවින් හා සාකච්ඡා කිරීමට වෙනත් කාරණා නොමැති බැවින් ගරු සභාපතිතුමාගේ ස්තුති කතාවෙන් අනතුරුව මුදල් හා ප්‍රතිපත්ති කමිටුව පෙ.ව.11.00ට අවසන් කරන ලදී.

මූලාසනය සභාව අමතමින් මීළඟට න්‍යාය පත්‍රාණුකූලව 2022 පෙබරවාරි මස ආදායම්,වියදම් වාර්තා හා සභාවේ වාහන සඳහා ඉන්ධන භාවිතය පිළිබඳ වාර්තා සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

# මාසික ලැබීම් සාරාංශය

## මීගහකිවුල ප්‍රාදේශීය සභාව

**මාසය - 2022 මාර්තු**

| ආදායම් ශීර්ෂය | ආදායම් ප්‍රභවය | මුදල (රු) |
|---|---|---|
| 1/71 | වැටුප් ප්‍රතිපූර්ණය | 1,991,929.36 |
| 1/71 | මන්ත්‍රී දීමනා | 270,000.00 |
| 1/13 | ව්‍යාපාර බදු | 57,600.00 |
| 1/62 | පෝරම ගාස්තු | 1,440.00 |
| 1/44 | වීථි රේඛා හා නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීම | 7,450.00 |
| 1/47 | වාහන නවතා තැබීමේ ගාස්තු | 12,880.00 |
| 1/36 | දැන්වීම් පුවරු ගාස්තු | 16,780.00 |
| 1/63 | මුද්දර ගාස්තු | 104,372.00 |
| 1/64 | සේවක ණය (පොළී) | 256.19 |
| 1 | සේවක ණය | 5,422.32 |
| 1 | තැන්පත් (2022 මාර්තු මස කාර්ය මණ්ඩල ප්‍රතිපූර්ණය වැඩිපුර ලැබීම) | 561.17 |
| 2/12 | කර්මාන්ත බදු | 4,200.00 |
| 2/23 | පොදු පහසුතා මධ්‍යස්ථානය | 32,760.00 |
| 2/31 | බලපත්‍ර ගාස්තු | 35,000.00 |
| 2/62 | පෝරම ගාස්තු | 450.00 |
| 2/66 | වෙනත් ආදායම් | 2,300.00 |
| 2 | තැන්පත් (වෙළඳ බලපත්‍ර) | 3,500.00 |
| 3/22 | තාවකාලික කඩ ලැබීම් | 12,850.00 |
| 3/23 | ටෙන්ඩර් කඩ කුලී | 127,300.00 |
| 3 | තැන්පත් (ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන-ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය/ බස් නැවතුම්පල කඩ ප්‍රදාන මුදල්) | 10,060,902.69 |
| 4/14 | ජල ලැබීම් | 264,893.00 |
| 4/41 | නව ජල සම්බන්ධතා ගාස්තු | 1,500.00 |
| | | |

| | | |
|---|---|---|
| 6/15 | සභාව සතු ඉඩම් හා කුළී (පිටමාරුව පුංචි ලෝකාන්තය) | 38,360.00 |
| 6/62 | අබලි ද්‍රව්‍ය විකිණීම /පුස්තකාල පෝරම ගාස්තු | 650.00 |
| 6 | තැන්පත් (පුස්තකාල තැන්පත් ගාස්තු/ පිටමාරුව පුංචි ලෝකාන්තය 30% කොමිස් ගාස්තු) | 16,990.00 |
| 5/23 | සතිපොළ ගාස්තු ලැබීම් | 234,087.50 |
| 5 | තැන්පත් (මීගහකිවුල සතිපොළ ටෙන්ඩර් ඇප තැන්පත්ගාස්තු ලැබීම්) | |
| 173 | අත්තිකාරම් පියවීම | 1,155.00 |
| වාහන හා යන්ත්‍රෝපකරණ කුලියට දීම | | |
| 1/45 | ට්‍රැක්ටරය කුළියට දීම | 1,250.00 |
| 1/46 | බවුසරය කුලියට දීම | 4,000.00 |
| 3/43 | ටොන් 2 ගල්රෝල කුලියට දීම | 1,750.00 |
| 3/43 | ටිපර් රථය කුලියට දීම | 12,000.00 |
| **එකතුව** | | **13,324,589.23** |

## 2022 මාර්තු මස ගෙවීම් විස්තරය - මීගහකිවුල ප්‍රාදේශිය සභාව

| අනු අංකය | ගෙවන ලද දිනය | ගෙවීම්ලාභි නම හා විස්තරය | මුදල (රු) |
|---|---|---|---|
| 1 | 2022.03.03 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - පුංචි ලෝකාන්තයේ ආරක්ෂිත වැට ඉදිකිරීමේ කටයුතු සඳහා වියදම් ලෙස සභා අරමුදලින් අත්තිකාරම් මුදලක් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම. | 100,000.00 |
| 2 | 2022.03.03 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව,සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම වෙනුවෙන් ගෙවීම. | 4,820.00 |
| 3 | 2022.03.03 | එස්.එම්.එල්.එච්.ජයවර්ධන මැතිතුමා - ගරු සභාපතිතුමා පාලත තුළ හා කොළඹ රාජකාරි ගමන් වියදම් 2022 පෙබරවාරි මස ගෙවීම. | 20,000.00 |
| 4 | 2022.03.03 | ජේ.එම්.විජිත ප්‍රියන්ත මයා, රියදුරු - ගරු සභාපතිතුමා සමඟ පලාත තුළ හා කොළඹ රාජකාරි ගමන් වියදම් 2022 පෙබරවාරි මස ගෙවීම. | 9,100.00 |
| 5 | 2022.03.03 | ටී.වසන්ති මිය, වර්ණසූරිය ඔටෝ සර්විස් ඇන්ඩ් මෝටර් ගාරාජ්, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු PF 5485 කැබ් රථය සර්විස් කිරීම වෙනුවෙන් ගෙවීම. | 25,910.00 |
| 6 | 2022.03.03 | ආදායම් ගණකාධිකාරි(ඌව), ලංකා විදුලිබල මණ්ඩලය,බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු වීදි ලාම්පු 2022 ජනවාරි මස විදුලි බිල්පත් පියවීම. | 2,106.60 |
| 7 | 2022.03.03 | ආදායම් ගණකාධිකාරි(ඌව), ලංකා විදුලිබල මණ්ඩලය,බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු බස් නැවතුම්පල 2022 ජනවාරි මස විදුලි බිල්පත් පියවීම. | 349.80 |
| 8 | 2022.03.03 | ආදායම් ගණකාධිකාරි(ඌව), ලංකා විදුලිබල මණ්ඩලය,බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ නව කාර්යාල ගොඩනැගිල්ලේ 2022 ජනවාරි මස විදුලි බිල්පත් පියවීම. | 3,113.10 |

| | | | |
|---|---|---|---|
| 9 | 2022.03.03 | ආදායම් ගණකාධිකාරි(ඌව), ලංකා විදුලිබල මණ්ඩලය,බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ පැරණි කාර්යාල ගොඩනැගිල්ලේ 2022 ජනවාරි මස විදුලි බිල්පත් පියවීම. | 935.40 |
| 10 | 2022.03.03 | ආදායම් ගණකාධිකාරි(ඌව), ලංකා විදුලිබල මණ්ඩලය,බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු තල්දෙන ජල පොම්පාගාරයේ 2022 ජනවාරි මස විදුලි බිල්පත් පියවීම. | 816.00 |
| 11 | 2022.03.03 | ආදායම් ගණකාධිකාරි(ඌව), ලංකා විදුලිබල මණ්ඩලය,බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු මීගහකිවුල ජල පොම්පාගාරයේ 2022 ජනවාරි මස විදුලි බිල්පත් පියවීම. | 18,851.20 |
| 12 | 2022.03.03 | කලමනාකරු, රත්න සුපර් සිටි, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවට අයත් නව බස්නැවතුම්පල තීන්ත ආලේප කිරීම සඳහා අවශ්‍ය ඉමල්ෂන් තීන්ත හා ෆ්ලෝ පේන්ට් ලීටර් 01 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 6,290.00 |
| 13 | 2022.03.08 | කලමනාකරු, රත්න සුපර් සිටි, මීගහකිවුල - මීගහකිවුල සභා අරමුදලින් ද්‍රව්‍යාධාර ලබා දීම යටතේ ලබා ගත් ද්‍රව්‍ය බිල්පත් පියවීම.(2020) | 20,000.00 |
| 14 | 2022.03.08 | කලමනාකරු, රත්න සුපර් සිටි, මීගහකිවුල - මීගහකිවුල සභා අරමුදලින් ද්‍රව්‍යාධාර ලබා දීම යටතේ ලබා ගත් ද්‍රව්‍ය බිල්පත් පියවීම.(2020) | 4,000.00 |
| 15 | 2022.03.08 | කලමනාකරු, රත්න සුපර් සිටි, මීගහකිවුල - මීගහකිවුල සභා කාර්යාලයට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 3,130.00 |
| 16 | 2022.03.08 | කලමනාකරු, රත්න සුපර් සිටි, මීගහකිවුල - මීගහකිවුල සභා කාර්යාලයට සනීපාරක්ෂක ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 8,668.00 |
| 17 | 2022.03.08 | කලමනාකරු, රත්න සුපර් සිටි, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ ජල යෝජනා ක්‍රම වලට අවශ්‍ය උපාංග මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 1,290.00 |
| 18 | 2022.03.08 | එම්.ආර්.නිබන් මයා, අංක 05,වතු නිවස, රෝබේරිය වත්ත, පිටමාරුව - 2022 පෙබරවාරි මස සඳහා පිටමාරුව පුංචි ලෝකාන්ත ආදායමෙන් 30% කොමිස් මුදල් නිදහස් කිරීම. | 6,000.00 |
| 19 | 2022.03.08 | එච්.එම්.නදීකා සංජීවනී මිය, බුබුලේ බැද්ද, මැදගම - 2022 වර්ෂය සඳහා බස් නැවතුම්පල නව ටෙන්ඩර් කිරීමේදී තැබූ ආපසු ගෙවනු ලබන ඇප තැන්පත් මුදල් නිදහස් කිරීම. | 20,000.00 |
| 20 | 2022.03.08 | කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම් මයා, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - ග්‍රාමීය මාර්ග වැඩසටහන 2021 යටතේ ලිපිගොණු වල අඩුපාඩු සැකසීම සඳහා අතිකාල දීමනා ගෙවීම. | 874.20 |
| 21 | 2022.03.08 | කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම් මයා, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - කොළඹ ග්‍රාමීය අමාත්‍යාංශයට යෑම වෙනුවෙන් ගමන් වියදම් දීමනා 2022 ජනවාරි මස ගෙවීම. | 1,750.00 |
| 22 | 2022.03.08 | කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම් මයා, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට යෑම වෙනුවෙන් ගමන් වියදම් දීමනා 2022 ජනවාරි මස ගෙවීම. | 5,488.00 |

| | | | |
|---|---|---|---|
| 23 | 2022.03.08 | කේ.තරිඳු දර්ශන ප්‍රියකැළුම් මයා, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - කොළඹ මාර්ග අමාත්‍යාංශය මහ නැගුම ව්‍යාපෘතිය සඳහා යැම වෙනුවෙන් ගමන් වියදම් දීමනා 2022 පෙබරවාරි මස ගෙවීම. | 3,060.00 |
| 24 | 2022.03.08 | ඒ.බී.සී.ඔටෝ ට්‍රෙන්සි, ගෙලිඔය - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු UPPF 5485 කැබ් රථයේ මඩ කවර මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම සිදු කිරීම | 7,700.00 |
| 25 | 2022.03.08 | ඩබ්.එම්.ඩී.සුරම්‍යලතා මිය, ඩාර්ලි ඔට්ල් හොටෙල් ඇන්ඩ් ගෙස්ට්, නුවර පාරථ මීගහකිවුල - සැමට ජලය ව්‍යාපෘතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා සංග්‍රහ කටයුතු වෙනුවෙන් ගෙවීම් කිරීම | 1,620.00 |
| 26 | 2022.03.08 | ඩබ්.එශාන්ත කුමාර, ලක්බන සුපර් සෙන්ටර්, 16 කණුව, මීගහකිවුල - මීගහකිවුල පොදු වැසිකිලියේ නව වැසිකිලි වළ සඳහා අවශ්‍ය ළිං වළලු 02ක්, පියන් 01ක් ප්‍රවාහනය කර සවි කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම | 12,750.00 |
| 27 | 2022.03.09 | ඩබ්.එම්.ජයලත් මයා, සම්බන්ධීකරණ ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 2022 පෙබරවාරි මස ගරු සභාපතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම්ගේ දීමනාව ගෙවීම. | 10,000.00 |
| 28 | 2022.03.09 | ඩී.එම්.නන්දසේන මයා, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - පළාත් පාලන දෙපාර්තමේන්තුව ලිපි ලේඛණ ගෙන යාම වෙනුවෙන් ගමන් වියදම් 2021 දෙසැම්බර් මස ගෙවීම. | 840.00 |
| 29 | 2022.03.09 | ඩී.එම්.නන්දසේන මයා, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - කාර්යාලීය රාජකාරී සඳහා බදුල්ල යාම වෙනුවෙන් ගමන් වියදම් 2021 අප්‍රේල් මස ගෙවීම. | 490.00 |
| 30 | 2022.03.09 | කාංචනා ද සොයිසා මිය, සංවර්ධන නිලධාරි (II) - ප්‍රසම්පාදන කාර්යයන් උපදෙස් සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවට යාම වෙනුවෙන් ගමන් වියදම් 2022 පෙබරවාරි මස ගෙවීම. | 800.00 |
| 31 | 2022.03.09 | එම්.ඩී.කේ.සී.ගුණතිලක මිය, සභා ලේකම් - 2022 පෙබරවාරි මස ගමන් වියදම් ගෙවීම | 4,000.00 |
| 32 | 2022.03.09 | එස්.එම්.ඒකනායක මයා, ආදායම් පරීක්ෂක - පලාත් පාලන කඩකුලී පිළිබඳ කටයුත්තක් සඳහා බදුල්ල අධිකරණයට යාම වෙනුවෙන් ගමන් වියදම් 2022 ජනවාරි මස ගෙවීම. | 1,720.00 |
| 33 | 2022.03.09 | එස්.එම්.ඒකනායක මයා, ආදායම් පරීක්ෂක - බදු මුදල් අය කිරීම සඳහා ක්ෂේත්‍රයට යාම වෙනුවෙන් ගමන් වියදම් 2022 පෙබරවාරි මස ගෙවීම. | 2,500.00 |
| 34 | 2022.03.09 | එස්.එම්.ඒකනායක මයා, ආදායම් පරීක්ෂක - බදු මුදල් අය කිරීම සඳහා ක්ෂේත්‍රයට යාම වෙනුවෙන් ගමන් වියදම් 2022 ජනවාරි මස ගෙවීම. | 2,500.00 |
| 35 | 2022.03.09 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - පුංචි ලෝකාන්තය සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමට අත්තිකාරම් මුදලක් ගැනීම. | 75,000.00 |
| 36 | 2022.03.09 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - පුංචි ලෝකාන්තය සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා අතින් දැරූ වියදම් ගෙවීම. | 11,760.00 |
| 37 | 2022.03.09 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 2022 මාර්තු මස මුදල් කමිටු දීමනා ගෙවීම. | 2,500.00 |
| 38 | 2022.03.09 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම සඳහා ගෙවීම. | 4,860.00 |

| | | | |
|---|---|---|---|
| 39 | 2022.03.10 | කොන්ත්‍රාත් පදනමින් බඳවා ගන්නා ලද යන්ත්‍ර සහයක සහ යන්ත්‍ර ක්‍රියාකරු වැටුප් - 2022 පෙබරවාරි මස ගෙවීම. | 106,720.00 |
| 40 | 2022.03.10 | ආදේශක වැටුප් 2022 පෙබරවාරි මස ගෙවීම. | 126,470.54 |
| 41 | 2022.03.10 | ඩී.එම්.ආර්.යූ.කේ.දිසානායක මයා, ලංකා ඉන්ධන පිරවුම්හල, 14 කණුව, මීගහකිවුල - 2022 පෙබරවාරි මස ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 193,725.00 |
| 42 | 2022.03.15 | කළමනාකරු, සහන් ටයර් හවුස්, පස්සර පාර, විහාරගොඩ - මීගහකිවුල ප්‍රාදේශීය සභාව LL 6984 ටිපර් රථය සඳහා 900 x 20 සියෙට් ටයර් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 116,000.00 |
| 43 | 2022.03.16 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන්ස් ලිමිටඩ්, බදුල්ල - මීගහකිවුල ප්‍රාදෙශීය සභාව සතු UPLL 7774 කැබ් රථය සඳහා රක්ෂණ වාරිකය ගෙවීම. | 32,325.73 |
| 44 | 2022.03.16 | ඒ.එම්.විජිත ප්‍රියන්ත මයා, රියදුරු - ගරු සභාපතිතුමා සමඟ පලාත තුළ හා කොළඹ යාම වෙනුවෙන් අතිකාල දීමනා 2022 පෙබරවාරි මස ගෙවීම. | 10,196.00 |
| 45 | 2022.03.21 | 2022 මාර්තු මස මන්ත්‍රී දීමනා ගෙවීම. | 294,000.00 |
| 46 | 2022.03.21 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව,මීගහකිවුල - 2022 මාර්තු මස මහ සභා රැස්වීම් සංග්‍රහ වියදම් සඳහා අත්තිකාරම් මුදලක් ගැනීම. | 12,000.00 |
| 47 | 2022.03.21 | ඩී.එම්.සංජීව නුවන් මයා, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - 2022 පෙබරවාරි මස සේවය කිරීම වෙනුවෙන් දෛනික වැටුප් ගෙවීම. | 23,464.81 |
| 48 | 2022.03.21 | ඒ.එම්.විජිත ප්‍රියන්ත මයා, ප්‍රාදේශීය සභාව, මීගහකිවුල - රියදුරු නිල ඇඳුම් දීමනා ලබා ගැනීම සඳහා ගෙවීම. | 4,000.00 |
| 49 | 2022.03.21 | එම්.කේ.දයාවංශ මයා, නො. 06, උඩමතුබ, වටගොම්මන, පිටමාරුව - පිටමාරුව සති පොල ශුද්ධ පවිත්‍ර කිරීම වෙනුවෙන් 2021 දෙසැම්බර්, 2022 ජනවාරි හා පෙබරවාරි මස වලට ආදාල දීමනාව ගෙවීම. | 6,500.00 |
| 50 | 2022.03.21 | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් කොමසාරිස් කාර්යාලය, මුද්දර බදු අංශය, කොළඹ 02 - 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ වෙලඳ බලපත්‍ර මුද්දර ගාස්තු තැම්පත් නිදහස් කිරීම වෙනුවෙන් ගෙවීම. | 83,325.00 |
| 51 | 2022.03.22 | සභා ලේකම්, ප්‍රාදේශීය සභාව,මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 252-6368 කැබ් රථයේ දුම් වාර්තාව හා ආදායම් බලපත්‍ර ලබා ගැනීම සඳහා අත්තිකාරම් මුදලක් ලබා ගැනීම. | 12,000.00 |
| 52 | 2022.03.23 | සී/ස ඌව පළාත් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය, බදුල්ල - A4 පැකට් 15 මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම. | 14,925.00 |
| 53 | 2022.03.23 | හේමසිරි නානායක්කාර මහතා, 412/16, වානගුරු මාවත, හෝකන්දර උතුර - මීගහකිවුල/කළුගහකදුර/පිටමාරුව පුස්තකාල තුන සඳහා හිමි අහිමි කෙටි කතා සංග්‍රහය හා පැතුමක පිය සටහන් කාව්‍ය සංග්‍රහය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම. | 1,350.00 |
| 54 | 2022.03.23 | කළමනාකරු, තව්දූ පොත්හල, මීගහකිවුල - මහජන පුස්තකාල තුන සඳහා 2021 දෙසැම්බර් /2022 ජනවාරි මාස වල ලබා ගත් පුවත්පත් සඳහා ගෙවීම | 27,290.00 |

| | | | |
|---|---|---|---|
| 55 | 2022.03.23 | ආදායම් ගණකාධිකාරි(ඌව) ලංකා විදුලි බල මණ්ඩලය, අංක 04, ස්ප්‍රිංවැලි පාර හිඳගොඩ, බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු වීදි ලාම්පු වල 2022 පෙබරවරි මස විදුලි බිල්පත් පියවීම. | 1,539.30 |
| 56 | 2022.03.23 | ආදායම් ගණකාධිකාරි(ඌව) ලංකා විදුලි බල මණ්ඩලය, අංක 04, ස්ප්‍රිංවැලි පාර හිඳගොඩ, බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු මීගහකිවුල බස්නැතුම්පොලේ 2022 පෙබරවරි මස විදුලි බිල්පත් පියවීම. | 313.20 |
| 57 | 2022.03.23 | ආදායම් ගණකාධිකාරි(ඌව) ලංකා විදුලි බල මණ්ඩලය, අංක 04, ස්ප්‍රිංවැලි පාර හිඳගොඩ, බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ නව කාර්යාල ගොඩනැගිල්ලේ 2022 පෙබරවරි මස විදුලි බිල්පත් පියවීම. | 2,198.10 |
| 58 | 2022.03.23 | ආදායම් ගණකාධිකාරි(ඌව) ලංකා විදුලි බල මණ්ඩලය, අංක 04, ස්ප්‍රිංවැලි පාර හිඳගොඩ, බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ පැරණි කාර්යාල ගොඩනැගිල්ලේ 2022 පෙබරවරි මස විදුලි බිල්පත් පියවීම. | 752.40 |
| 59 | 2022.03.23 | ආදායම් ගණකාධිකාරි(ඌව) ලංකා විදුලි බල මණ්ඩලය, අංක 04, ස්ප්‍රිංවැලි පාර හිඳගොඩ, බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු මීගහකිවුල ජල පොම්පාගාරයේ 2022 පෙබරවරි මස විදුලි බිල්පත් පියවීම. | 8,212.80 |
| 60 | 2022.03.23 | සහකාර වාණිජ්‍ය අධිකාරි ශ්‍රී ලංකා ටෙලිකොම්, බදුල්ල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 055-2245775 දරණ දුරකතන බිල 2022 පෙබරවාරි මස පියවීම. | 4,689.09 |
| 61 | 2022.03.23 | මොබිටෙල් පුද්ගලික සමාගම, අංක 109, ගාලු පාර, කොළඹ 03 - මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ පෙරටු කාර්යාලයේ E.S.M.S 2022 පෙබරවාරි මස බිල්පත් පියවීම. | 61.30 |
| 62 | 2022.03.23 | එස්.එම්.එල්.එච්.ජයවර්ධන මැතිතුමා - ගරු සභාපතිතුමා පාලත තුළ හා කොළඹ රාජකාරි ගමන් වියදම් 2022 මාර්තු මස ගෙවීම. | 20,000.00 |
| 63 | 2022.03.23 | ඒ.එම්.විජිත ප්‍රියන්ත මයා, ගරු සභාපතිතුමා සමඟ පළාත තුල හා කොළඹ රාජකාරි ගමන් වියදම් 2022 මාර්තු මස ගෙවීම. | 7,350.00 |
| 64 | 2022.03.23 | ආර්.එම්.සී.දිල්හාන් රත්නායක මයා, යන්ත්‍ර සහයක - පිටමාරුව පුංචිලෝකාන්තයට යාම වෙනුවෙන් ගමන් වියදම් 2022 මාර්තු මස ගෙවීම. | 5,950.00 |
| 65 | 2022.03.23 | ඩී.එම්.සංජීව නුවන් මයා, රියදුරු - පිටමාරුව පුංචිලෝකාන්තයට යාම වෙනුවෙන් ගමන් වියදම් 2022 මාර්තු මස ගෙවීම. | 5,950.00 |
| 66 | 2022.03.24 | එම්.ආර්.නිබන් මයා, අංක 05,වතු නිවස, රෝබේරිය වත්ත, පිටමාරුව - 2022 පෙබරවාරි මස සඳහා පිටමාරුව පුංචි ලෝකාන්ත ආදායමෙන් 30% කොමිස් මුදල් නිදහස් කිරීම. | 12,000.00 |
| 67 | 2022.03.24 | කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම - 2022 මාර්තු මස | 1,934,922.61 |
| 68 | 2022.03.24 | නව අභ්‍යාස ලාභී උපාධිධාරි එස්.එම්.නවෝදා දිලිනි මෙයගේ 2022 මාර්තු මස වැටුප් ගෙවීම. | 44,875.60 |

| | | | |
|---|---|---|---|
| 69 | 2022.03.25 | ටී.වසන්ති මිය, වර්ණසූරිය ඔටෝ සර්විස් ඇන්ඩ් මෝටර් ගාරාජ්, මීගහකිවුල - මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු 252-6368 කැබ් රථයේ වාර සේවා සිදු කිරීම වෙනුවෙන් ගෙවීම. | 24,040.00 |
| 70 | 2022.03.30 | කේ.ඩී.ජී.එම්.ගුණසිංහ, හංසවිල නිවස, පේරගස්වත්ත,මීගස්පිටිය - 2022 වර්ෂය සඳහා බස් නැවතුම්පල නව ටෙන්ඩර් ලබා දීමේදී තැන්පත් කළ ආපසු ගෙවන තැන්පත් මුදල නිදහස් කිරීම. | 20,000.00 |
| 71 | 2022.03.30 | එච්.එම්.ශ්‍රියා කුමාරි මිය, ශ්‍රියා නිවස, මීගහකිවුල - 2022 වර්ෂය සඳහා මීගහකිවුල බස් නැවතුම්පල කඩ ටෙන්ඩර් ලබා දීමේදී තැන්පත් කළ ආපසු ගෙවන තැන්පතු කළ ආපසු ගෙවන තැන්පතු මුදල් පියවීම. | 20,000.00 |
| | | **මුළු එකතුව** | **3,582,738.78** |

**2022 මාර්තු මස ආදායම්, වියදම් වාර්තා හා සභාවේ වාහන සඳහා ඉන්ධන භාවිතය පිළිබඳ වාර්තාව සම්මත කිරීමට සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි සාමාවතී මැතිණිය යෝජනා කල අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.රත්නතිස්ස මැතිතුමා ස්ථිර කලේය.**

**ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතවය මත 2022 මාර්තු මස ආදායම්, වියදම් වාර්තා හා සභාවේ වාහන සඳහා ඉන්ධන භාවිතය පිළිබඳ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

## ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස්

### ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා සභාව අමතමින් මේ වෙනකොට රටේ යම් දේශපාලන ප්‍රශ්නයක් තියෙනවා. මම ඒ ගැන කතා කරන්න උත්සාහ කරනවා නෙමෙයි. හැබැයි ප්‍රාදේශිය මට්ටමේ සමහර දේශපාලන නායකයින්ගේ ක්‍රියාකලාපය වගේම සමහර දේවල් දකින කොට ඉතාමත් අප්පිරියයි. මොකද මිනිස්සු පාර්ලිමේන්තුවට ගියා 225ම එපා කියලා. එහෙම තමයි අද ගොඩනැඟිලා තියෙන්නේ.

ඒවාගේම අපි දැක්කා සමාජ මාධ්‍ය හරහා ප්‍රාදේශිය සභා වලටත් යම් යම් නොයෙකුත් දේවල් සමාජ මාධ්‍ය හරහා කියලා තිබුණා. විශේෂයෙන්ම ෆේස්බුක් හරහා කියලා තිබ්බා. ඒක මිනිස්සුන්ගේ අයිතිය. හැබැයි මේ ප්‍රාදේශිය සභාවේ විතරක් නෙවේ නොයෙකුත් ප්‍රාදේශිය සභාවල නියෝජනය කරන මන්ත්‍රීවරු මේ ධුරයේ සිටිද්දිම ඒ දේ හරි අනුමැතියි කියලා ඒවා ෆේස්බුක් ශෙයා කරනවා නම් තම ධුරයේ ඉඳගෙන ශෙයා කරන කට්ටිය ඇත්තටම ලැජ්ජා වෙන්න ඕන මොකද අපි දැකලා තිබ්බා ගමේ කොන්ත්‍රාත් කරන ප්‍රාදේශිය බොක්කුවෙන් පාරෙන් කොමිස් ගහපු එහෙම කතාන්දර ගහපු පෝස්ට් එකක් ෆේස්බුක් හරහා ශෙයා වෙලා තිබුණා.මේ ප්‍රාදේශිය සභාව නියෝජනය කරමින්. අපි දැක්කා පසුගිය මේ ආණ්ඩුව පත්වෙන්න කලින් සමහර ඔය ශෙයා කරන උදවිය මේ මීගහකිවුල තුළම සමහර ව්‍යාපෘති එතුමලා හරහාම තමයි සිද්ධවුණේ. මේ වේලාවේ දේශපාලනය ජනතාව අතරට ගිහිල්ලා තමන් හරි අපි නිවැරදියි කියන යම් උත්සාහයක් තමයි දරන්නේ කියන එක ඒ දේවල් වලින් පේනවා. මම කියන්නේ ජනතාව ප්‍රශ්නයක් නැහැ. ඔවුන්ගේ අයිතිය ඒක. සමහර පිරිසක් එක පැත්තකට යනකොට වහල්ලු ඒ පැත්තට කඩේ යනවා කියලා.මිනිස්සු කියන්නේ 225ම එපා කියලා. හැබැයි දේශපාලනයේ නිරත වෙලා ඉන්න සමහර මන්ත්‍රීවරු කියන්නේ අපි අර 225 ගොඩේ ඉන්න කෙනෙක් වෙනුවෙන් ඔවුන් කඩේ යනවා.ඒ දෙක නොතේරෙන කමක් තමයි තියෙන්නේ.ඒ නිසා මහජන නියෝජිතයෝ වශයෙන් තමන්ගේ ධුර කාලය තිබෙද්දි මේ වගේ දේවල් කිරීම තුළ ඇත්තටම ලැජ්ජයි.මේ වේලාවේ කියන්න තියෙන්නේ මේ වෙනකොට ප්‍රශ්නයක් වෙලා තියෙනවා ඒක ජනාධිපතිතුමා පාර්ලිමේන්තුව එකතුවෙලා ඒක විසඳාගනී. අපි ප්‍රාදේශිය සභාවක් විදිහයට ප්‍රශ්නේ විසඳන්න බැහැ. අපි මෙතන කතා කරත් අපිට ඒ ප්‍රශ්නය විසඳන්න බැහැ. ඒ දේ මම මතක් කරනවා මොකද සභාවක් විදිහයට මේකේ කවුරුහරි ශෙයා කරලා නම් ඒක වැරදි කියනවා නෙමෙයි හැබැයි තමන් එහෙම ව්‍යාපෘති කරා. අපි දැක්කා. ඒක නිසා ඒ පිළිබඳව අදහස් දක්වමින් ලබන්නා වූ අලුත් අවුරුද්ද ගරු සභාපතිතුමා සියළු මන්ත්‍රීවරුන්ට ඒ වගේම ලේකම්තුමිය ඇතුළු සියළු කාර්ය මණ්ඩලයට

මීගහකිවුල ප්‍රාදේශිය ජනතාවට සියළු දෙනාට සුභ අලුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.බොහොම ස්තුතියි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුමතිපාල උඩලකුඹුර මැතිතුමා</u>**

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුමතිපාල උඩලකුඹුර මැතිතුමා සභාව අමතමින් මම කාරණා දෙකක් විතරයි කතා කරන්නේ.මන්ත්‍රීවරුන්ට පසුගිය කාලයේ ලක්ෂ 20ක් ඉල්ලලා දුන්නා ප්‍රතිපාදන. ඒ අනුව අපි ඉදිකිරීම් කරලා තියෙනවා. ප්‍රාදේශිය හරහා ඒක කරේ. කරුණාකරලා ඒ චෙක්පත් කඩිනමින් ලබාදීමේ කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

දෙවැනි කාරණය අපේ ගොවි ජනතාව බලපාන පොහොර ප්‍රශ්නය අපි මේ සභාවේදි කතා කරා. මම යෝජනාවක් හැටියට කරා ඒක ස්ථිරත් කරා අපේ නිමල් මන්ත්‍රීතුමා. මම දැනගැන්න කැමැතියි මම එදා කිවුවා ඒ වාර්තාව කරුණාකරලා ජනාධිපතිතුමාට යවන්න කියලා ඒක යැව්වාද නැද්ද කියලා මට දැනගන්න ඕනි. මොකද මේ සභාවේදි යම් යෝජනා ආවාම ඒවා ක්‍රියාත්මක නොවේනවානම් තව යෝජනා කරත් ඉදිරියට වැඩක් නැහැ. රුපියල් 75000.00 යෝජනා පිළිබඳ අපි විවිධ අවස්ථා වලදි හැම ඉල්ලීමක්ම දීලා තියෙනවා. හැබැයි අදත් විෂයභාර නිලධාරිතුමිය කිව්වා මෙන්න මේ දේවල් අඩුයි කියලා. අලුතින් ආපු අපේ ලේකම්තුමියටත් කියනවා ඉදිරියේදි කටයුතු කරද්දි පොඩ්ඩක් බලන්න. මම දැනගන්න කැමැතියි ඒ යෝජනා යැව්වාද කියලා. ඊයේ ගරු අග්‍රාමාත්‍යතුමා ප්‍රකාශයක් කරා අනිවාර්යෙයන්ම පොහොර සහනාධාරය දෙන්න කටයුතු කරනවා කියලා. අපි සභාවක් විදිහයට ඒ යෝජනාව ගියාද කියලා වැදගත් වෙනවා.

මුලාසනය සභාව අමතමින් ඒක ගිහිල්ලා නැත්නම් ඕක එන්නේ නැහැ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. චමින්ද ප්‍රදීප් මැතිතුමා</u>**

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. චමින්ද ප්‍රදීප් මැතිතුමා සභාව අමතමින් අපේ උප සභාපතිතුමා මතු කරපු කරුණට පිළිතුරක් දිය යුතුව තියෙනවා. මං හිතන්නේ මේ පෝස්ට් එක ගැන තමයි කියන්නේ.මමත් ශෙයා කරපු පෝස්ට් එකක්.අපේ නන්දන මන්ත්‍රීතුමා තමයි මේක ඉස්සෙල්ලාම ශෙයා කරලා තිබුනේ. මමත් දැම්මා. මේකේ තියෙන්නේ “ මතක තබාගන්න ලොකු හොරා සමඟම ගමේ බොක්කුවෙන් පාරෙන් හොරකම් කරපු කොමිස් ගත්ත පොඩි හොරුන්ද එලවා දැමිය යුතු කාලය එළඹ ඇත.” මේකේ වැරුද්දක් නැහැ උප සභාපතිතුමා.අපි හොරකම් කරලා නැහැ කොමිස් අරගෙන නැහැ එහෙම අරගත්ත අය ගාවගත්තට කමක් නැහැ. මේක ශෙයා කරාට වැරුද්දක් නැහැ.

මුලාසනය සභාව අමතමින් අපි මිනිස්සු වෙලා ඉපදිලා අපි තිරිසන්නු කියලා යෝජනා කරගන්න ඕනි නැහැ. දැන් ස්වයං විවේචනයක යෙදෙනවා මේ රටේ මිනිස්සු යෝජනාවක් ගෙනල්ලා තියෙන්නේ අපේ දේශපාලඥයෝ 225 එපා කියලානේ. ඔබතුමාගේ පක්ෂය නියෝජනය කරන කට්ටියත් අපේ පක්ෂය නියෝජනය කරන කට්ටියත් ඔක්කොමනේ එපා කියලා කියන්නේ. මේ වැරදි මතය මිනිස්සු අතරට ගිහිල්ලා. නමුත් මේ 225 නැතුව හරක්ද මේක කරන්නේ. ගෝල්ෆේස් එකට ආපු කට්ටියද මේක කරන්නේ. කරන්න කෙනෙක් නැහැනේ. ඒ හින්දා මන්ත්‍රීතුමා වැරදි මතයක් නිර්මාණය කරලා අපි නරකයි කියලා අපි කියන්න ඕනි නැහැ.මේ ඉන්න එක මන්ත්‍රීවරයෙක් කොන්ත්‍රාත් කරලා නැහැ. මේ ඔක්කොම කරලා තියෙන්නේ සමිති වලින්. ඒවා හොරා කැවද නැද්ද කියලා හොයලා බලන්න කාර්මික නිලධාරි ඉන්නවා අධීක්ෂණය කරන්න. මන්ත්‍රීවරුන් මෙතනට සම්බන්ධ නැහැ.යෝජනාව විතරයි ගෙනත් දෙන්නේ. මම බය නැතුව කියනවා ඔයාලාවත් හොරා කාලා නැහැනේ බොක්කුවෙන්.හොරකැවේ සමිතිය.ඔයාලාට විතරක් අදාල නැහැනේ මේක ඔක්කොටම අදාලයි.අපේ කණ්ඩායම හොරා කාලා නැහැ.සමිති වලින් හොරා කාලා තියෙන්නේ. අපි සල්ලි විතරයි දීලා තියෙන්නේ.

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා සභාව අමතමින් නන්දන මන්ත්‍රීතුමා ශෙයා කරපු පෝස්ට් එකක් තියෙන්නේ මේකේ “ නේම්

බෝඩ් එක පාරවල්වල ගහන නේම් බෝඩ් එක උඩින් ගහලා තියෙනවා මේවා මිනිස්සුන්ගේ බදු මුදල් වල සල්ලි කියලා. මම කියන්නේ එයාලාගේ ෆොටෝ දාලා පාරවල් වල බෝඩ් නැද්ද. මන්ත්‍රීතුමාගේ ෆොටෝ දාලා බෝඩ් නැද්ද.එතකොට ඇයි මේවාගේ පෝස්ට් ශෙයා කරන්නේ.තමන් මේ දේවල් කරානේ. අපි දන්නවා ජනතාවගේ මුදල් වලින් තමයි මේ පාරවල් හැදුවේ.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. චමින්ද ප්‍රදීප් මැතිතුමා සභාව අමතමින් අනුන් share කරපු ඒවා ගේ වගකීම ගන්නෙ නැහැ. මම share කරපු එකේ වගකීම මම ගන්නවා.

මූලාසනය සභාව අමතමින් අපි ප්‍රාදේශීය සභාවට ආවේ ඇයි, අපි ආවේ වැඩක් කරන්න නේ. මිනිස්සුන්ගේ පාරවල් හදන්න. පහුගිය දවස් වල මීගහකිවුලේ වතුර නැහැ කියලා අවුරුදුගානක් මිනිස්සු කෑ ගැහුවා. ඒකට අපි සම්බන්ධ වුණේ නැත්නම් ඒක මෙතනට එනවද. මිනිස්සුන්ගේ බදු මුදල් වලින් හරි මිනිසුන්ගෙන් බලෙන් අරගෙන හරි වතුර ටික එන්නේ අපි යෝජනා කරපු නිසා. ඒ හින්දා මේ වැරදි මතයක් මේ රට තුළ යෝජනා කරල මේ රටේ ආණ්ඩුවක් කරන්න මිනිහෙක් නැතුව මේ රට ඩයස්පෝරාවේ හරක් නැති කරලා දාන්න යන්නේ. ඒක නිසා මේ 225ම එපා කියන්නේ නැහැ ඔබතුමාගේ නායකයත් ඕනි ජනතා විමුක්ති පෙරමුණේ නායකයා ඕනි අපේ නායකයා ඕනි කවුරු හරි නායකයෙක් මේ රට කරන්න ඕනි. අපි දේශපාලනයේ ඉන්නවා කියලා නැහැ. අපිට දැන් කාලෙත් ඉවරයි. අපි හෙට අනිද්දා යයි. මේක කරේ නැත්නම් ඔබතුමා කියන්නේ ගමේ මිනිහෙක් ඇවිල්ලා අර පාර හදන්න කියන්න මේ පාර හදන්න. එහෙමනම් engineers ඕන නැහැ. මොකෙක් වත් ඕන නැහැ. කැම්පස් වහන්න ඕන. දේශපාලඥයෝ ඕනෙත් නැහැ.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා සභාව අමතමින් පුංචි දුන්හිඳ හරහා ඔබතුමා සභාව මැදිහත් වෙලා සභාවෙන් එකතුවෙලා කරානෙ. හැබැයි ඔය share කරපු මිනිස්සු ඒ පොස්ට් share කරාද නැනේ.

මූලාසනය සභාව අමතමින් ඒ පෝස්ට් ශෙයා කරේ නැහැ වතුර දෙනවා. ඒ photo share වෙන්නේ නැහැ. මගේ තනි ෆොටෝ එකක් දැම්මත් මට like එනවා දෙසීයක් විතර. මේක දැම්මම එන්නේ 32. මේ මුළු ගමටම වතුර දෙනවා. හැබැයි ඇවිල්ල තියෙන්නේ 32යි. අපි අවංක දේ කරාම එන්නේ නැහැ. මේ ජනමතය වෙනස් කරන්න ඕනි මන්ත්‍රීතුමා මේ ක්‍රමයට උදව් කරන්න එපා.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. චමින්ද ප්‍රදීප් මැතිතුමා සභාව අමතමින් මම කියපු දේ මම ස්ථාවරයේ ඉන්නවා. මම පෝස්ට් එක ශෙයා කරා. ඔබතුමා කියන්නේ මන්ත්‍රීවරු කියලා නේ මමත් ඒ අතරේ ඉන්නවා. මම share කරපු පෝස්ට් එකේ වගකීම මම භාර ගන්නවා. අනිත් අයගේ ඒවා මම දන්නේ නැහැ. මිනිස්සු 225 එපා කියන්නේ හොරු දූෂිතයෝ නිසා නේ. නැත්නම් වෙන හොඳ මිනිස්සු නම් එපා කියන්නේ නැහැනේ .

මූලාසනය සභාව අමතමින් 225 ම හොරු ද?

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. චමින්ද ප්‍රදීප් මැතිතුමා සභාව අමතමින් වෙන්න ඇති. නැත්තම් මිනිස්සු එහෙම කියන්නේ නැහැනේ. හොඳ අයත් ඇති මට ඒ වගකීම භාරගන්න බැහැ. නමුත් මේ පෝස්ට් එක ශෙයා කරපු එකේ වගකීම මම භාර ගන්නවා. මම කොමිස් ගහලත් නැහැ. මම හොරකම් කරලත් නැහැ. ඕන තැනක මම කාගෙන් හරි කොමිස් ඉල්ලලා තියෙනවද.

මූලාසනයේ සභාව අමතමින් මේ ඉන්න මන්ත්‍රීවරු කොමිස් අරගෙන තියෙනවා නම් මට කියන්නකො.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. චමින්ද ප්‍රදීප් මැතිතුමා සභාව අමතමින් මම කියන්නේ ඔයාලත් ශෙයා කරන්න ඒ පෝස්ට් එක.

මූලාසනය සභාව අමතමින් අපි ශෙයා කරන්න තරම් මෝඩයෝ නෙවෙයි මන්ත්‍රිතුමා එච්චර ඔලුවක් නැති මිනිස්සු නෙවෙයි අපි නම්.

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. චමින්ද ප්‍රදීප් මැතිතුමා සභාව අමතමින් හැම දෙනාටම ලබන්නා වූ සිංහල හින්දු අලුත් අවුරුද්ද සාමය සතුට පිරි සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා බොහොම ස්තූතියි .

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා</u>**

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා සභාව අමතමින් කතා නොකර සුභ අලුත් අවුරුද්දක් වේවා කියන්න හිටියේ. කතා කරන්න හිතුනා. ඇත්තටම අපේ උප සභාපති තුමා දැක් වූ අදහසින් මම අන්තර්ජාලයට යන්නේ නැහැ. ඒ අදහස සමාජගත වෙද්දී මෙ 2018දී ගෞරවනීය මන්ත්‍රීවරුන් විදිහට මහජන ඡන්දයෙන් මේ මීගහකිවුල ප්‍රාදේශීය සභාවට ඇවිල්ලා ගරු සභාපතිතුමා එක්ක මන්ත්‍රීවරු 17 මම හිතන්නේ අද ඒ පෝස්ට් එකේ දැක්කෙ ගමේ බෝක්කුවෙන් පාරෙන් කොමිස් ගහන ප්‍රාදේශීය සභා මන්ත්‍රීලා ඉන්නවයි කියන කාරණයේ දී මම හිතන්නේ ඒක ශෙයා කරන්න ඉස්සෙල්ලා ඔබ හිතන්න ඔබ ඔබේ ගමට මොකක්ද කළේ කියලා. ඒ තුළ තමා අපේ ගමේ අපේ මීගහකිවුල කියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අපේ බල ප්‍රදේශයේ මේ ප්‍රාදේශීය දේශපාලන නායකත්වය නැත්තං ගමේ බෝක්කුවක් ගමේ පාර ගමේ වතුර ටික මේ කිසි දෙයක් සිද්ධ වෙන්නේ නැහැ. ගරු සභාපතිතුමනි මන්ත්‍රීවරු 17 ඔබතුමා ඇතුළුව මේ සභාව නියෝජනය කරද්දි මිනිස්සු ජීවත් වෙලා මැරෙනකම් ඒ ගම බිහි වුණු දා ඉඳන් පුවක්ගහ වත්ත, කොස්කොටේ, ඌරුපිටිය ඒ වගේම ගම්මැද මාර්ගයේ ඉපදුණු දා පටන් ඒ මිනිස්සුන්ට මාර්ග පද්ධතියක් නැති වුණු අවස්ථාවක මීගහකිවුලේ නායකත්වය ලලිත් ජයවර්ධන මැතිතුමා ඔබතුමා ඇතුළු මේ මන්ත්‍රී මණ්ඩලයේ දායකත්වයෙන් තමයි අද පුවක්ගහ වත්තේ අවසාන ගෙදරට යනකම් පාරක් හදන්න කිව්වේ. ඒ ප්‍රාදේශීය දේශපාලන හා මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ නායකත්වය තිබ්බා. හැබැයි මම දන්න හැටියට ඒකෙන් කවුරුවත් කොමිස් ගහන්න ගියේ නෑ. වැලි ඇටයක්වත් කවුරුවත් ගත්තෙ නැහැ. ඒකට ගරු ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා පූර්ණ අනුග්‍රහය දුන්නා. ඒ කොන්ත්‍රාත්කරුවන් සමග ඍජු සම්බන්ධතා මේ කරන වැඩපිළිවෙළේ දී ගමට අවශ්‍ය කරන අද මීගහකිවුලේ පවුල් 6000කට එහා පානීය ජල අවශ්‍යතාවයක් ගේන්න ඔය පොස්ට් දාන කවුරුත් දේශපාලනයේ හිටියා. මම හිතන්නේ මේ ප්‍රාදේශීය සභාවේ බලය අපි ආව දා ඉඳන් මුල්ම චකවානුවේ දී ඔය සියලු දෙනා මේ ප්‍රාදේශීය දේශපාලන නායකත්වය ගත්තා. ආණ්ඩු බලය ඒ ගොල්ලන්ට තිබ්බා. හැබැයි ඔය වතුර ටික දෙන්න ඔය උනන්දුව තිබ්බෙ නැහැ. ඉතින් මම කියන්නේ අපි ඔක්කොම මේ දේශපාලනයට ආවේ ගමට වැඩක් කරන්න. මම හිතන්නේ මේ අවංක දේශපාලන නායකත්වය ලලිත් ජයවර්ධන ගරු සභාපතිතුමා ඇතුළු මේ දේශපාලන අධිකාරිය වෙනුවෙන් නියෝජනය කරන සියලු මන්ත්‍රීවරු මම හදවතින් ම දන්නවා අවංකව දේශපාලනය කරන්නේ. කවුරුත් කොමිස් කුට්ටිවලට යට වෙන මිනිස්සු නෙවෙයි. ඒ නිසා මම ඉල්ලන්නේ ඔබ වැරදි ජනමතයක් ජන ගත කරන්න හදනවා නම් ඒ ජන ගත කරන්න හදන මතය ඔබ නිර්දෝෂයි කියලා හිතලා ඔබ එක ශෙයා කරන්න හදනවා නම් ඒක වැරැද්දක්. හැබැයි අපි කරපු සේවය ඔබ හදවතින් විමසන්න. ඔබේ එදා ඔබ මේ දේශපාලනයේ ප්‍රාදේශීය සභාවට එන්න පෙර ඔබේ ගම තිබ්බ තත්ත්වය වසර 04ක් ගෙවෙද්දී දැන් ඔබේ ගමේ තියන තත්වය ඔබ තේරුම් ගන්න. ඒ ඔබ දේශපාලනයට ඇවිල්ලා ප්‍රාදේශීය දේශපාලන නායකත්වය අරගෙන ගමට ම වැඩක් කරපු නිසා තමා ඔබේ ගම යම් තලයකට මේ අවුරුදු හතර තුළ සංවර්ධනය කරා ගේන්න පුළුවන් උනේ. මම හිතන්නේ මගේ කොට්ඨාසය වෙත කෝටි 20 කට වැඩියෙන් මේ අවුරුදු 04 තුළ ප්‍රතිපාදන වෙන් වුණා. ඉතින් ඒ හින්දා අපි 225 දැන් මතයක් යනවා 225 එපා කියලා. රටේ තත්ත්වයක් තියෙනවා මිනිස්සුන්ට අමාරුයි. හැබැයි ඒක දේශපාලනීකරණය කරන්න ගිහිල්ලා ඒ ජනමතය වැරදි අතට අවබෝධ කරන්න යන්න එපා කියන ඉල්ලීම මේ සභාවේ නියෝජනය කරන ගරු මන්ත්‍රීලාගෙන් මම ඉල්ලනවා. මොකද අපි වැඩක් කරා. අපි දෙයක් කරා. හැබැයි මේ රටේ තියන තත්වය දිහා අපිට හඬක් නගන්න අපි පුළුවන් දේ කරමු. මම යෝජනා කරනවා පුළුවන් නම් ගරු සභාපතිතුමනි මම මේක ඔබතුමාට අදහස් කරනවා යෝජනා කරනවා අපිට පුළුවන් නම් මම මීගහකිවුලේ තරුණයෝ එක්ක කතා කරා. අපිට පුළුවන් හාල් ටිකක් දෙන්න. පොල් ගෙඩියක් දෙන්න. අපිට පුළුවන් නම් හැබැයි මට එතැනදී පැන නැගුණු නැගුණු ප්‍රශ්නය කවුද කොහොමද කවුරු තෝර දන්නවද කොච්චරක් දෙනවාද. ඉතින් මම යෝජනා කරනවා පුළුවන් දෙයක් අපිට මේ වෙලාවේ කරන්න බැරි වෙයි. සිංහල අලුත් අවුරුද්ද කාලේ හින්දා ඉදිරියේදී අවශ්‍ය වුනොත් ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීවරුන්ගේ මාසික සභා

දීමනාව අපි කැප කරමු. පුළුවන් නම් මේ අප්‍රේල් මාසය ඔබට යම් ගැටලුකාරී තත්ත්වයක් ඇති. හැබැයි ඉදිරියේදී අවශ්‍ය වුනත් අපේ මාසික සභා දීමනාව කැප කරමු. අපිට පුළුවන් එක මිනිහෙකුට යමක් කරන්න පුළුවන් නම් අපේ දීමනාව කැප කරලා මම යෝජනා කරනවා. ඉදිරි මැයි මාසයේ ඉදන් අපේ සභා දීමනාව අපි අත්හරිමු. රට යහපත් තත්ත්වයක් උදා වෙනකන් කියන යෝජනාව මම මේ ගරු සභාවට යෝජනා කරනවා. සියලු දෙනාට මේ උදා වෙන සිංහල අවුරුද්දේ මම ඉල්ලන්නේ ඔබට පුළුවන් නම් අල්ලපු ගෙදරට හරි උදව්වක් කරන්න ඒ තුළින් ඔබට මේ තියෙනා වූ කාරණාව මම කියන්නේ උද්ඝෝෂණ කරන්න ඕනේ නැහැ. අපිට කරන්න ඕනි දේ මොකද්ද මේ රටට රුපියලක් හරි අපිට ගෙනත් දෙන්න පුළුවන් නම් එතකොට කියයි ඩොලර් නේ ප්‍රශ්නේ කියලා. අපිට ඩොලර් හොයන්න බැහැ. නමුත් අපිට රුපියලකින් අපේ සමාජයට යම් දෙයක් එකතු කරල යමෙකුට යමක් කරන්න පුළුවන් නම් ඒ තුළ අපි එකතු වෙලා කියන එක කියමින් සියලු දෙනාටම සුභ අලුත් අවුරුද්දක් සුභ දවසක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා .

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා</u>**

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා සභාව අමතමින් මම දේශපාලනය ගැන කතා කරන්න යන්නේ නැහැ. අද අපේ චමින්ද මන්ත්‍රීතුමා නගපු ප්‍රශ්නයත් එක්ක අපේ නම් අවුරුදු 4 ½ ඉවර වෙන්න යන්නේ. නමුත් එතුමාලාගේ අවුරුදු 2ක් බලයේ හිටිය අපි අවුරුදු 2 ½ යි බලයට ඇවිල්ලා. ඔබතුමාලත් අවුරුදු 2ක් හිටියා.ඔබතුමාලත් කෝටි 2 ½ වැඩ කරාත් ඔබතුමාගේ හෘද සාක්ෂියට ඔබතුමා වැඩ කරද්දි ඔබතුමාට අපි උදව් කරා. අපි සභාවක් විදිහට අපි ඕන උදව්වක් කරනවා කියලා ඔබතුමාලත් අපිට උදව් කරේ නැහැ කියනවා නෙවෙයි. නමුත් ඔබතුමා කෝටි 2 ½ ඔබතුමා කොට්ඨාසයේ අවුරුදු 2කට ඊට පස්සේ රංගන මන්ත්‍රීතුමා අවුරුදු 2 ½ ක් කොච්චර වැඩ කරල තියනවද. ඒ ගමේ සංවර්ධනය එතනින් මං හිතන්නේ කොමිස් ගත්ත කියලා ඔබතුමා ඔප්පු කරන්න පුළුවන් නම් ඔප්පු කරල නිකම් කතාවට ආපු පලියට කතා කරන්න එපා.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. චමින්ද ප්‍රදීප් මැතිතුමා සභාව අමතමින් කවුරුවත් කොමිස් ගැහුවා කියලා නැහැ. එතන තියෙනවද කවුරුත් කොමිස් ගත්ත කියලා.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා සභාව අමතමින් ඒ උදාහරණයෙන් මට පැහැදිලි වෙන්නේ මම දකින විදිහට මේකෙ එහෙම නැහැ. ගමේ සංවර්ධනය වෙන කොට ඒකෙ මොකක් හරි ප්‍රශ්නයක් තියනවනම් ගමේ බෝක්කුවක් හදනවා නම් ඒකේ අඩුපාඩු හදන්න කියලා කෙටියෙන් කියන්න අපේ කොට්ඨාස භාරව.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. චමින්ද ප්‍රදීප් මැතිතුමා සභාව අමතමින් මේකේ කියලා නැහැ වැඩ කරේ නැහැ කියලා. අපි ඔක්කොම වැඩ කරා. එහෙම දෙයක් මේ පෝස්ට් එකේ නැහැ.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා සභාව අමතමින් මේ වෙලාවේ ඔබතුමාලා එකක් ශෙයා කරාද අපි මෙච්චර සංවර්ධනය කරා, අපේ කොට්ඨාස වල එකක් ඔබතුමා හොඳ පැත්තට ශෙයා කරලාද. සභාපතිතුමා ඔබතුමාත් අපිත් ඔක්කොම එකතු වෙලා ගෙනපු ජල යෝජනා ක්‍රමයේ එකක්වත් තවමත් සභාපතිතුමා විතරයි ෆොටෝ දාලා තියෙන්නේ. නමුත් ඒක ශෙයා එකක්වත් කමෙන්ට් එකක්වත් දාලා නැහැ. ඔක්කොම පක්ෂ බේදයක් නැතුව ආවා.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා සභාව අමතමින් ඔයාලා කෝටි 2 ½ වැඩ කරන්නේ. මේක නන්දන මන්ත්‍රීතුමා share කරපු එකක්. මේකේ තියෙන්නේ බෝඩ් එකක්.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. චමින්ද ප්‍රදීප් මැතිතුමා සභාව අමතමින් ඒකෙ වගකීම මම භාර ගන්නේ නැහැ.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා සභාව අමතමින් වගකීම බාරගන්න කියන්නේ නැහැ. තමන්ගේ රූප ගහලා දානකොට දන්නෙ නැද්ද තමන්ගේ ෆොටෝ එකත් එකේ තියෙනවද කියලා දන්නේ නැද්ද.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා සභාව අමතමින් ඒක වැරැද්දක්. ඔබතුමා කරත් මම කරත් වැරැද්ද වැරැද්දම තමයි. එතනින් එහාට මම කතා කරන්න යන්නෙ නැහැ. තව හොඳ ආදර්ශයක් දුන්නා චන්ද්‍රසිරි මන්ත්‍රීතුමා කිව්වා. තමන්ගේ හෘද සාක්ෂියෙන් අහන්න තමා වැරදි කරා කියලා කාගෙන්වත් අහන්න ඕන නැහැ තමන්ගේ හෘදසාක්ෂියෙන් අහන්න කවුද කරේ කියලා. බුද්ධාගම අදහන ආගම අපි හැටියට ඒ ටික ඇති පඩිසන් දෙන්න ගත්ත ද නැද්ද කියලා. මීට ඉස්සෙල්ලත් මම යෝජනා කරා චන්ද්‍රසිරි මන්ත්‍රීතුමාට ඉස්සෙල්ලා අපේ දීමනාව අපි ඔක්කොම දෙමු කියලා. ඒ වෙලාවේ චමින්ද මන්ත්‍රීතුමා කිව්වා මට නම් දෙන්න විදිහක් නැහැ කියලා මට ජීවත් වෙන්න විදිහක් නැහැ කියලා. හොඳ උදාහරණයක් හරින් මන්ත්‍රීතුමා එතුමගෙ මන්ත්‍රී ප්‍රතිපාදන පාර්ලිමේන්තුවේදී එතුමා දෙනවා කිව්වා. නමුත් මගේ එක වුණත් මේ මාසේ වත් මට ඕන නැහැ. මම දෙනවා මම දෙනවා අහිංසක මිනිස්සුන්ට ජීවිතේ ඇද ගන්න අපේ වැටුපෙන් හරි එහෙම දෙයක් කරගන්න පුළුවන් නම් එතන ඒක හොඳ වැඩක්. තමන්ට ප්‍රයෝජනයක් ගන්න තියෙනවා නම් ඒ දේ කරමු ඒ දේට මම එකඟ වෙනවා. මගේ වැටුප මම අදම දෙන්නම් හැබැයි මම විතරක් නෙවෙයි ඔක්කොම දෙන්න ඕන.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ආර්.චන්ද්‍රසිරි දිසානායක මැතිතුමා සභාව අමතමින් මන්ත්‍රීවරු 17 මේ කැප කිරීම කරනවා නම් සමානව ඒ කොට්ඨාස ඉන්න අසරණ පවුල් වලට ඒ ප්‍රතිලාභය යන්න ඕනේ. ඒ හින්දා ඒ යෝජනාව කරනවා.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. චමින්ද ප්‍රදීප් මැතිතුමා සභාව අමතමින් හරින් මන්ත්‍රීතුමා තමන්ගේ දීමනාව දෙනවා කියලා කිවුවට අනිත් අය දුන්නේ නැහැනේ.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඩබ්.එම්.සමන්ත කුමාර මැතිතුමා සභාව අමතමින් හරීන් මන්ත්‍රීතුමා වැටුප දෙනවා කියපු එක නෙවෙයි. හරින් මන්ත්‍රීතුමා කතා කරපු එක්ක කතා කරන්න ඕනේ. රට හදන්නේ කොහොමද කියලා සජිත්ට ටොක්කක් ඇනලා කිව්වා මේ වෙලාවේ මොනාද කරන්න ඕනේ කියලා.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.නිමල් දිසානායක මැතිතුමා සභාව අමතමින් තරුණ පරපුර දැන් උද්ඝෝෂණය රට හැම තැනම උද්ඝෝෂණය කරලා කවදාවත් මේ රට ගොඩනගන්න බැහැ. ඔබතුමාගේ විදේශිකව ඉන්න අය ඇති එයාලට කියන්න ඩොලර් දෙන්න කියලා. අවශ්‍ය දේ කරන්න 225 කියන්නේ අපේ කට්ටියත් අයිති ඔබතුමාලගේ කට්ටියත් අයිති වටේ ඉන්න අයත් අයිති පක්ෂ භේදයකින් තොරව 225ම එපා කියනවා. සියලු දෙනාට සුභ අලුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.බාලසුන්දරම් මැතිතුමා</u>

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.බාලසුන්දරම් මැතිතුමා සභාව අමතමින් ජනතාව උද්ඝෝෂණය කරනවා තමයි. මම නම් දකින විදියට ජනතාව උද්ඝෝෂණය කරන්න ඕනේ 225 විතරක් නෙවෙයි අපිටත් එක්ක ඒගොල්ලොත් දොස් කියන්න ඕනි. ඇයි අපි සභාවෙන් කතා කරන මොන යෝජනා හරි අපි රටේ මන්ත්‍රීතුමාට හෝ ජනාධිපතිතුමාට ප්‍රාදේශීය සභාවට යොමු කරලා නැහැ. මම ගිය සභාවේ දී රංගන මන්ත්‍රීතුමා දන්නවා මම කතා කරා මේ රට ගොඩනඟන්න තියෙන එකම දේ ගොවියාට නැවත පොහොර ලබා දෙන්න ඕන. ඒ කාබනික පොහොර නවත්තලා රසායනික පොහොර ලබා දෙන්න ඕනේ කියලා එතුමා පිළිගත්තා. ඒ කියන්නේ මේ ගමේ ජනතාව අපේ කොට්ඨාසයට පත් කරල තියෙන්නෙ කොට්ඨාසය ජනතාවට මොනවද ඕනේ කියන දේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු දන්නෙත් නැහැ ජනාධිපතිතුමා දන්නෙත් නැහැ අගමැතිතුමා දන්නෙත් නැහැ කොට්ඨාසයේ අපි තමයි දන්නෙ. ඒක තමයි අපිව පත් කරල තියෙන්නෙ. අපි මේ තියන තත්වය

මේ තියන දේවල් ඉහල තැන් වලට අපි වාර්තා නොදුන්න එක තමයි රට මේ තත්වයට පත්වෙන්න හේතුව කියලා මම හිතනවා. ඒ වගේම එක එක්කෙනාට අපි දොස් කියා ගන්නේ නැතුව අපිට පුලුවන්නම් අපේ ගමේ අපේ කොට්ඨාසය හදන්න මොනවද කරන්න පුළුවන් කියලා අපි සැලසුමක් හදලා අපේ ජනතාවට කරන්න පුළුවන් අපේ අවස්ථාවට මොනව ද ඒවාට යොමු කරලා අපි ඊට අවශ්‍ය දේවල් කරන්න උත්සාහ කරා නම් ඒක වටිනවා කියලා මම හිතනවා .

ඒ වගේම සුභ අලුත් අවුරුද්දක් කියලා කියනවට වඩා දෙමළ සිංහල සුභ අලුත් අවුරුද්දක් ලබන්නාවූ අළුත් අවුරුද්දේදී මේ රටේ තියෙන ආර්ථික අර්බුදය නැති වෙලා සියලු දෙනාටම සෞභාග්‍යය රටක් හැටියට අපි රටේ තියන ප්‍රශ්න වලින් බිඳිලා තවත් ඉදිරියට යන්න ඕනි. එක එක්කෙනා තම තමන් උද්ඝෝෂණය කරන්නේ නැතුව තම අයිතීන් ඉල්ලන්න ඕන නමුත් අපි හිතන්න ඕනි මේ ඔක්කොටම වඩා රටේ මිනිස්සු ජීවත් වෙලා ඉන්න ඕන රට තියෙන්න ඕන කියන එක. නැත්නම් එහෙම එක එක් කෙනා වෙන දේවල් කරොත් මේ රට කවදාවත් ගොඩනගන්න බැහැ. මගේ එක අදහස මට පක්ෂයෙන් ප්‍රශ්නයක් වෙයි කමක් නැහැ ඇත්ත කියන්නේ මේ පාර්ලිමේන්තුවේ දී කිව්වා හවුල් ආණ්ඩුවක් හදමු. හරින් මහත්තයා කිව්වා. ඕන එක්කෙනෙක් සජිත් මහත්තයා රනිල් වික්‍රමසිංහ මහත්තයා ජේවීපී ඉන්න නායකයා හරි රට භාරගන්න කියලා. ඒත් කිසි කෙනෙක් බාර ගන්න ආවේ නැහැ. නමුත් මම අහන්නේ ඉස්සරහට බාර ගන්න එක්කෙනෙක්වත් නැත්තම් රට කරන්න කෙනෙක් නැත්තං කරන්න පුළුවන් එක්කෙනෙක් සැලසුමක් ගෙනල්ලා මේක මන්ත්‍රී පක්ෂ නැතුව මම හිතන්නේ මමත් මහජන නියෝජිතයෙක් හැටියට අපේ ගමේ ජනතාවගේ තත්ත්වය අනුව මම කියන්නේ කවුරු හරි ඉස්සරහට ඇවිල්ල කරන්න. මේක තමයි සැලසුම මේ විදියට කරන්න මේ රට ගොඩගන්න පුළුවන් කියන යෝජනාව ඉදිරිපත් කරන්න කියලා. මොන පක්ෂයක් වුණත් කමක් නැහැ. දේශපාලන කවුරු හරි ඉදිරිපත් වෙන්න. මේ දේ කරමු කියලා. එහෙම කරානම් මේ රට මෙච්චර ප්‍රශ්නයක් එන්නේ නැහැ.

ඒ වගේම මම යෝජනාවක් කරනවා අද තියෙන බඩු මිල හැටියට අද ගොඩක් අසරණ වෙලා ඉන්නේ අපේ වතුකර ජනතාව. මං හිතන්නේ රුපියල් 1000 ක රුපියල් 700ක් පඩිය ඒගොල්ලන්ට දරාගන්න බැහැ මේ බඩු මිල හැටියට. ඒ නිසා මං හිතන්නේ හවුල් ආණ්ඩුවක් හෝ තියෙන ආණ්ඩුවක් හෝ මොන ආණ්ඩුවක් වුණත් කමක් නැහැ මේ වතුකර ජනතාවට මේ බඩු මිලට හරියන වැටුපක් ලබා දීම සම්බන්ධව කටයුතු කරන ලෙස මම ඉල්ලීමක් කරනවා. බොහොම ස්තුතියි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා</u>

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා සභාව අමතමින් ඉතාමත් තීරණාත්මක අවස්ථාවක මේ එකතු වෙන්නේ. රටේ ප්‍රශ්නයක් තිබෙන වෙලාවක සමහරු ජනාධිපතිවරු අගමැතිවරු වෙන්න හීන දකින වෙලාවක. තවත් සමහරක ජනතාව කුපිත කරවලා ජීවිතේටවත් මහජන ඡන්දයෙන් බලයට එන්න බැරි උදවිය යම්කිසි ජනතා උද්ඝෝෂණයකින් බලයට එන්න හදන අවස්ථාවක්. මං හිතන්නේ බාල මන්ත්‍රීතුමා හොඳ ප්‍රවේශයකට ආවා. කරන්න බැහැ ගෙදර යන්න කිව්වම ජනාධිපතිතුමා කිව්වා ඇවිල්ල භාරගන්න කියලා. ඊට පස්සේ රූපවාහිනිය සාකච්ඡා වල ආර්ථික ඔස්තාර්ලා හර්ෂ ද සිල්වා සජිත් ප්‍රේමදාස තෙල් නැව් වෙනවා කිව්වා. හැබැයි කරන්න කිව්වම බයේ දුවනවා. ඒ හින්දා සභාපතිතුමා කිව්වා වාගේම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා නැති උනොත් ලේකම්තුමියට බලය පවරා මේක කරගෙන යන්න දෙනවා. රටේ ජනාධිපතිගේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු ටික නැති උනොත් එතනින් එහාට මේක ගෙනි යන්නේ කොහොමද කියන කාරණාව තියෙනවා. ඒ හින්දා අපි මෙතන ප්‍රාදේශීය දේවල් කතා කරාට මේකටත් මේක අදාලයි. ප්‍රාදේශීය සංවර්ධනය, ප්‍රාදේශීය පරිපාලනය සියලු දෙනාටම මේක අදාලයි. ඒක නිසා මේ පුපුරලා ගිහිල්ලා තියෙන්නෙ 1977 දී ගත්ත තීන්දුවක ප්‍රතිඵලයක්. මොකද 77ට ඉස්සෙල්ලා අපේ රටේ යම් කිසි තැනක තිබ්බා. අපිට අවශ්‍ය කර්මාන්ත ටික තිබ්බා ලැලි ටික තිබ්බා පොහොර ටික හැදුවා රෙදි ටික හදා ගත්තා ඒ අවශ්‍ය සියලු 90% ක් කර්මාන්ත අපේ රටේ තිබ්බා. 77 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින් විවෘත ආර්ථිකය ගෙනල්ලා ඒ සියලු කර්මාන්ත ටික විනාශ කරලා පිටරටින් එනකම් මුහුදට දත නියවන ඉන්න තත්වයට ප්‍රතිඵලයක් විදිහට තමයි අද අපි මේ තත්ත්වයට ඇවිල්ලා ඉන්නේ. මේකට අඩු වැඩි වශයෙන් මේ රට පාලනය කරපු සියලුම දෙනාම වගකිව යුතුමයි.

ජේ.ආර්.ජයවර්ධන, ප්‍රේමදාස, ඩී.බී.විජේතුංග, චන්ද්‍රිකා කුමාරතුංග, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා සියල්ල. මේ අද උද්ගත වෙලා තියෙන අර්බුදයට වගකිව යුතු පාර්ශවකරුවන් වෙනවා. හැබැයි ඒ සියලු දෙනාම ගත්තම මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා අඩුම ගානේ අපිට මේ රටේ යුද්ධය අවසන් කරලා සැනසිල්ලේ ඉන්න පුළුවන් වාතාවරණය ගොඩනගලා දුන්නා. මට මතකයි කපිල මන්ත්‍රීතුමා මේ සභාවේ ඔබතුමා උප සභාපති අපිට ඒ දවස් වල කොටි උඩින් බෝම්බ දානකොට ගිනි නිවන රථයක් ගෙනත් තියන්න කියලා කියනවා. මෙතන මේ මේකට බෝම්බයක් දායි කියලා. එහෙම යුගයක් නිමා කරලා දීලා අද අපි නිදහසේ හුස්ම ගන්නවා. යම් යම් තැන්වල යම් යම් අඩු ලුහුඩුකම් වෙන්න ඇති. හැබැයි අද අපි සමාජ මාධ්‍ය දැක්කහම සිංහලයෝ තරම් මනුස්සකමක් නැති ඒ වචන පාවිච්චි කරත් කමක් නැහැ තිරිසන් ජාතියක් මේ ලෝකේ ඉන්නවා ද කියන මතය අපිට යන්න වෙනවා. ඒ තරමට අධම විදිහට අතීතයේ අර ප්‍රභාකරන් කිව්වා වගේ දවස් 7යි මතකේ තියෙන්නේ. ඔය කාරණාවට අපිට හිතෙනවා ඒ තැනට ගියා. ඒ වගේම මේ ඔක්කොම රාජ්‍ය සේවකයෝ ගත්තම ඔබතුමියලා නෙමෙයි. මේ ගෝඨාභය මහත්තයට මහින්ද මහත්තයාට පින් සිද්ධ  වෙන්න ගෙදර හිටපු උපාධිධාරියෝ ගෙනල්ලා පත්වීම් දීල ස්ථිර කරලා අද තමන්ම ශෙයා කරනවා ගෝඨා go home කියලා. නැත්තම් අදත් ගෙදර රැකියා විරහිත උපාධිධාරීන් විදිහට. ඒ හින්දයි ඒ වගේ මනුස්සකමක් නැති පිරිසක් අතර තමයි ජීවත් වෙන්නේ. මිනිස්සුන්ට අමතකයි මේ රටේ යුද්ධයක් තිබ්බා. මේ රටේ කොරෝනා ව්‍යසනයක් තිබ්බා. ඒ සියල්ල අමතකයි. ඒ අමතක වීම තුළ දැන් ආර්ථික අර්බුදය කොහොමද ආවේ ඒ ඔක්කොම අමතකයි. දැන් මේක කේන්ද්‍රීය ගත කරලා තියෙන්නේ ගෝඨාභය හොරකම් කරා. මම දන්නේ නැහැ කොහොමද එහෙම හොරකම් කරන්නේ කියලා. ලංකාවේ තිබ්බ ඩොලර් සංචිත ඔක්කොම හොරකම් කරා එක අවස්ථාවක මහ බැංකුව මංකොල්ල කෑවා. එතකොට ඔය කියන පිරිස පාරට බැස්ස නම් අපේ ලංකාව මීට වැඩිය ලස්සන වෙන්න  ඉඩ තිබ්බා. හම්බන්තොට වරාය අවුරුදු 199 කට වික්කා. විකුණන කොට බදු දෙනකොට ඔය පිරිස පාරට බැස්ස නම් අපිට තිබ්බා. එතකොට සජිත් ප්‍රේමදාසලා හැංගිලා හිටියේ. රනිල් වික්‍රමසිංහ චෙක් ටික බදාගෙන ඉදිද්දි ඔය මිනිස්සු සද්ද නැතුව හිටියා. අනුර කුමාරලා සද්ද නැතුව හිටියේ. ඒ හින්දා අපි නිශ්ශබ්දව ඉන්න ඉන්න මම හිතන්නේ අපි මිනිස්සු හිතනවා ඇති අපි දුර්වලයෝ කියලා මේ පොස්ට් එකේ තියෙන්නෙ පගාව ගත්තෙ නැහැ කියලා නෙමෙයි කොමිස් ගැහුවෙ නැහැ කියලා නෙමෙයි ඒකෙ තියෙන්නේ ගමේ බෝක්කුවෙන්  පාරෙන් පගාව ගත්ත ප්‍රාදේශීය දේශපාලනය. ඒ පුද්ගලයත් මේකෙ තමයි ඉන්නේ. අපි දන්නවා පහුගිය කාලයේ කෝටි ගානක වැඩ කරා.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. චමින්ද ප්‍රදීප්  මැතිතුමා සභාව අමතමින් ඒ පුද්ගලයා කිව්වෙ කවුද මන්ත්‍රීතුමා

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා සභාව අමතමින් පුද්ගලයා කියලා කිව්වේ share කරපු අය. මම කාටවත් බාධා කරේ නැහැ නේ මන්ත්‍රීතුමා.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. චමින්ද ප්‍රදීප්  මැතිතුමා සභාව අමතමින් මමනේ ශෙයා කරේ.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා සභාව අමතමින් අපි ඔයාගේ එකවුන්ට් එකේ නැහැ. අපි දැක්කේ නන්දන මන්ත්‍රීතුමාගේ එකෙන්.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.බාලසුන්දරම් මැතිතුමා සභාව අමතමින් ඔබතුමා කිව්වා මහ බැංකුව සමඟ කතා කරනකොට හිටපු රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා ගැන. නමුත් එදා සම්මුඛ සාකච්ඡාවේදී එතුමා එහෙම හොරකමක් කරේ නැහැ කියලා කිව්වා.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා සභාව අමතමින් ඔයා කලබල වෙන්න එපා මම බාධා කරේ නැහැ නේ. මේක ප්‍රාදේශීය දේශපාලන අධිකාරිය තුළ මතයක් හදන්න හදනවා මම තමයි හරි කියලා. අපි එහෙම දෙයක් නැහැ. අපි

දැක්කා උද්ඝෝෂණයට ඒ පුද්ගලයෝ සම්බන්ධ වුණා. අපි එහෙම නැහැ අනිත් උන් තමයි මේ සභාවෙ ඉන්න උන් හොරු කියලා මතයක් හදනවා. සභාවක් විදිහට අපි ඔක්කොම මන්ත්‍රීවරු මෙතැන එකට ඉන්නවා. ඒ හින්දා අපි රටේ ප්‍රශ්නයක් තියෙනවා. ඒ ප්‍රශ්නෙට ග්‍රාමීය වශයෙන් විසඳුම් හොයන්න අපි එකතුවෙලා වැඩ කරන්න ඕනි. වතුර ප්‍රශ්නයක් තිබ්බා. මම දැක්කා මේක දානවා දානවා අපේ හාමුදුරුවොත් මේක දානවා. හැබැයි ආණ්ඩුව මේක පටන් ගත්තට පස්සේ ඔක්කොම නිශ්ශබ්දයි. කමෙන්ට් එකක් නැහැ. අපි දැක්කා පහුගිය කාලේ සජිත් ප්‍රේමදාස නිවාස ඇමති වෙලා ඉද්දි කරදගහමඩ ගෙවල් ටිකක් හැදුවා අනාථයි මිනිස්සු. බලගොල්ල ගෙවල් ටිකක් හැදුවා අනාථයි. හැබැයි අපි ග්‍රාමසේවක වසමකට ගෙවල් එක ගානේ හැදුවා. අද ඒ මිනිස්සු පදිංචි වෙලා ඉන්නේ.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ශ්‍රියාලතා මැතිණිය සභාව අමතමින් පක්ෂ දෙකේ දෙන්නෙක් ආණ්ඩුව කරේ.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රංගන මධුමල් සමරකෝන් මැතිතුමා සභාව අමතමින් සජිත් ප්‍රේමදාස මහත්තයාගේ තිබ්බේ අමාත්‍යාංශය නිවාස අමාත්‍යාංශය. ප්‍රතිලාභියන් තෝරලා ගෙවල් හදන්න කියලා මිනිස්සු ණය කාරයෝ කරේ. අපි පටන් ගත්තා එක ගෙයක් හදන්න. තල්දෙන එක ගෙයක පදිංචි කෙරෙව්වා. අනිත් එකේ වැඩ යනවා. ටීවර්ගේ හරි හැම ග්‍රාමසේවක වසම වාගේ කොහානේ ගෙදර පදිංචි කෙරෙව්වා. හැබැයි ඒකෙ ෆොටෝ එක අපි තමයි හරි කියපු මිනිස්සු කමෙන්ට් එකක්වත් ශෙයා එකක්වත් නෑ .අවශ්‍ය නැහැ හැබැයි අපි හරි විදියට දෙයක් කරල තියෙනවා. ඒ හින්ද මේ ජාතික ප්‍රශ්නයට අපි උත්තරයක් හොයන්න ඕනේ. මේක දැන් ආර්ථික අර්බුදයේ මිනිස්සු පාරට බැස්සෙ ගෑස් දෙන්න තෙල් දෙන්න කියලා. දැන් මේක බෞද්ධ විරෝධී අරගලය ගෝඨා go home කියලා වැඩිපුරම කෑගහන්නෙ කොළඹ ඉන්න රෑට නයිට් ක්ලබ් ලගින සෙට් එක. ඒක අපිට ඒකේ වීඩියෝව බැලුවම දැන ගන්න පුළුවන්. රෑට ඇවිල්ල ගෝල්ෆේස් එකේ නිදි යනවා. රෑට ක්ලබ් එකේ නිදිය ගත්තත් එකයි ගෝල්ෆේස් එකේ නිදිය ගත්තත් එකයි ඔය දෙකම එකයි නේ. අරක්කු ටික එතැනට යනවා බීම ටික එතැනට යනවා නම් ඒක ඔවුන්ගේ අයිතියක්. මේ ගහන්නෙ මම දකින විදිහට බෞද්ධ මූලයට. මම ඊයෙ දැක්කා උපුල් ශාන්ත සන්නස්ගලගේ වීඩියෝ එකක් තියෙනවා. එයා කණ්ඩායමක් එක්ක කියනවා. ආණ්ඩු පෙරලා ගෝඨා ගෙදර යවලා කමිටුවක් හදලා දලදා මලිගාවේ දේපල රාජසන්තක කරනවා. කතරගම දේවාලයේ තියෙන දේවල් රාජසන්තක කරනවා. එහෙම බෞද්ධ විරෝධී තැනකට මේ වෙනකොට අරගලය ඇර ගෙන යනවා. එතකොට පල්ලිය එළියට බැහැලා ඉන්නවා. පාස්කු ප්‍රහාරය අපි කරපු දෙයක් නෙවෙයි ත්‍රස්තවාදී කණ්ඩායමක් කරා. එකේ විමර්ශන යනවා. හැබැයි කාදිනල් හිමිපාණෝ කියනවා. මේ මැරිච්ච මිනිස්සුන්ගේ ලේ ස්වර්ගයට මොර ගානවා යුක්ති ඉල්ලන්න කියලා ඒක තමයි මේ. එතකොට කොටි ගම්වල සිංහල මිනිස්සු කැබිතිගොල්ලෑවේ මරද්දී ඔය කාදිනල්ලා ප්‍රභාකරන් බදාගෙන හිටියෙ. මේකත් යන්නේ ලෝක දේශපාලනය තියෙන භූ දේශපාලනයේ එක අණ්ඩක් විදිහට. මේක ක්‍රියාත්මක වෙන්නෙ ඒ හින්දා මේ කෙල වෙන්නේ අපිට සමහර දැන් වුන් එකේ ඉන්නවා. හරි අපේ ලොක්කා බලය එහි අපේ ලොක්කා මේක ගනී. ඒක නෙමේ මේ කෙල වෙන්නේ අනාගත පරම්පරාවට. මේකේ යන පෝස්ට් එක දැන් කුරගල කියන්නේ අපේ පන්සලක් ගෝඨාභය ජනාධිපතිතුමා ජනාධිපති වෙලා මුස්ලිම් අන්තවාදයෙන් අල්ලගෙන හිටපු එක අරගෙන පන්සල හැදුවා. ඔය උද්ඝෝෂණයේ බැනර් එකක් තියනවා. කුරගල මහජනයාට ගහලා කුරගල මුස්ලිම් අයට බාර දෙමු කියලා පෝස්ට් ශෙයා කරනවා. ගෝඨාට කඩේ යන කහකඩ යන්ට දානේ දෙන්න එපා කියලා. එහෙම තැනකට මේ අරගලය අරගෙන ඇවිල්ලා තියෙනවා. මේ වෙනකොට සද්ධාවෙන් යම් පිරිසක් පටන් ගත්තත් අද වෙනකොට අර තැනට අරගෙන ඇවිල්ලා තියෙනවා. ඒ හින්දා අපිත් ක්‍රියාකාරීව දායක විය යුතු වෙනවා මෙයට විරුද්ධව. ඊයේ පෙරේදා මම පෝස්ට් එකක් දැක්කා මට මේ මීගහකිවුලේ පුද්ගලයෙක් කියනවා. මීගහකිවුලට බැස්සත් අසූචි උණු කරල ගහනවා කියලා. අපි ලැහැස්ති පුලුවන්නම් ගහලා බලන්න. එහෙනම් මේ තියෙන්නෙ අපි නිකම් යූඑන්පී ශ්‍රී ලංකා දේ ජේවීපී එකද කියන කතන්දරය නෙමේ. මේ 2015 කරගන්න බැරි වෙච්ච දේ දැන් මේ ගෑස් අනං මනං ප්‍රශ්නත් එක්කකර ගන්න උත්සාහ කරන්නේ ඒ වගේම ගෝඨාභය ජනාධිපතිතුමා වරද්ද ගත්තේ තැනකුත් තිබ්බා. කොරෝනා වසංගතය එක්ක අපරාදේ එන්නත්කරණය සිදු කෙරේ. ලක්ෂ 7ක් 8ක් විතර මැරෙනකං ඉඳලා මේ එන්නත් කරනය සිදු කරා නම් හරි. අනිත් මිනිස්සු කතා කරන්නේ එන්නත්කරන සිදු කරන කොට සජිත් ප්‍රේමදාස ජේවීපී එක එන්නත්කරණය

සිදු කරගන්න එපයි කියලා කිව්වා. විශ්ව විද්‍යාලයේ ඉන්න අය එක එක දේවල් කිව්වා. එතුමා එහෙම ඵන්නතත්කරනය සිදු කරන ලෝකෙට ණය වෙලා ලංකාවෙ තිබ්බ ඩොලර් සංචිත ටික හරි වියදම් කරලා ඵන්නතත්කරනය සිදු කරපු ඒ නිසා තමයි අපි මෙහෙම ඉන්නේ. නැත්නම් ඉන්දියාව වගේ ගඟක මුහුදක මැරිල පාවෙනව. ඒවා අමතකයි අපිට කලින් ගහ ගත්තේ ඒ බනින මිනිස්සු ගිහිල්ලා .අපි ප්‍රාදේශීය දේශපාලනඥයෝ විදිහට මේක මැදිහත්වීමේ කාර්යභාරයක් තියෙනවා. තව ටික දවසක් යනකොට මේ තෙල් ප්‍රශ්න මේ ගෑස් ප්‍රශ්නය ඒ ප්‍රශ්න ටික විසඳෙනවා. දැන් එය උද්ඝෝෂණ වල තියෙන්නේ තෙල් ගෑස් කතන්දරයක් නෙවෙයි. දැන් එතැන තියෙන්නෙ ගෝ හෝම් ගොයා එච්චරයි. මේ සිංහල බෞද්ධ පදනමකුත් එක්ක බිහි ඉතිහාසයේ පළවෙනියට බෙහෙවින් මේ නායකත්වය එකෙන් ඉවත් කිරීමේ සාධනීය පියවර ගොඩක් ගත්තා නේ. එම් සී සී ගිවිසුම අහෝසි කරා. වරාය දුන්නේ නැහැ. ඒ වගේ රටට හිතකර පියවර ගණනාවක් ගත්තා. ඒ සියල්ල යට කරගෙන දැන් ඒක බලය ලබා ගන්න කෑදරකමින් සජිත් ප්‍රේමදාස ඉන්නවා අනුර කුමාර ඉන්නවා. ඒ අස්සෙ මූලයට ගහන්න පිරිසකුත් අපි අතර ඉන්නවා. අභාග්‍යයට හරි ඒ හින්දා අපි ප්‍රාදේශීය දේශපාලනඥයා විදිහට අපේ ගම්බද ව මිනිස්සුත් එක්ක අපි පහුගිය කාලේ උදව් කරා. ඒ වගේම කොළඹ කුරුඳු වත්ත සෙට් එකම බැහැලා. ඒ කියන්නේ ගමේ සංවර්ධනය නතර කරන්න කියලා. අපිට දෙන්න අඩුවට කන්න කියලා. ඔය කියන්නේ අඩුවට බඩු ගේන්න නම් ගමේ වැඩ නතර කරන්න ඕන. කොළඹට කිරි ගමට කැකිරි කියන කතන්දරේ යන්න දැන් කොළඹ ඉන්න මිනිස්සු උදේට වැඩක් රෑට ක්ලබ් එකට ගිහිල්ලා දාස් ගනන් වියදම් කරනඡ් සෙට් එකට එහෙට ප්‍රතිලාභ දෙන ගමේ මිනිසුන්ට දෙන දේ නතර කරලා දාන්න ඕකෙන් ඔය නොකියා කියන්නේ. ඒ හින්දා අපි ග්‍රාමීය ජනතාව දැනුවත් කරලා අපි එකතු වෙලා මේ කටයුත්තට සම්බන්ධවිය යුතු කියන කාරණය අපි මතක් කරනවා. මේ වගේ ම අපි අපිටම ගහ ගන්න එක නතර කරගමු කියන යෝජනාවක් මම කරනවා. මොකද එතුමා ප්‍රාදේශීය සභා මන්ත්‍රී වරයෙක් නොවුනානම් ගැටළුවක් නැහැ. එතුමත් මේ පුටුවේ ඉන්නවා. පුටුවෙ ඉන්න ගමන්ම ඔය කතන්දරේ කියනවා නම් ප්‍රශ්නයක්. මම දැක්කා තව පෝස්ට් එකක් තියනවා. සිංහල අවුරුද්දෙන් පස්සේ අපි මෙතැනට එන කොට මේ සියලු ප්‍රශ්න ගොඩක් දුරට විසඳිලා තියෙයි. ඊයෙ අග්‍රාමාත්‍යතුමාගේ ආමන්ත්‍රණය තේක්ක ගොඩක් දේවල් අපිට සමාජයේ තිබ්බ මත ගොඩක් ඒවා වෙනස් වෙලා. බාල මන්ත්‍රීතුමා මොන කතන්දරේ කිව්වත් උදේ මගෙත් එක්ක බයික් එකේ එන ගමන් කිව්වා. අගමැතිතුමාගේ කතාව හරියට හිතට වැදුනු උදේ මිනිස්සුත් එක්ක කතා කරා බැන්න මිනිස්සු දැන් ටිකක් ඉන්නවලු. ඒක නිසා ගොඩක් ප්‍රශ්න විසඳිලා ගෝ home ගෝයා නෙවෙයි. ගෝයා තව අවුරුදු හය හතකට මේ රටේ ජනාධිපති ධූරය අනිවාර්යයෙන්ම රැඳී සිටිනවා .ඒ හින්දා මේ රටේ මෝඩ මිනිස්සු නෑ.එළඹෙන මේ සිංහල හින්දු අවුරුද්දෙන් පස්සේ මේ ප්‍රශ්න විසඳිලා නැවත වාරයක් අපිට හොඳින් වැඩ කරන්න පුළුවන් වාර්තාකරණය බිහි වන බව ඒකාන්තයි. ඒ සඳහා අවශ්‍ය මුහුණ දෙන්න අපි සූදානම් වෙමු. මේ ලබන සිංහල හින්දු අවුරුද්ද සුභ අවුරුද්දක් වේවායි කියා ප්‍රාර්ථනා කරමින් සියලු දෙනාටම ස්තුතියි .

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ශ්‍රියාලතා මැතිණිය</u>

මුලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ශ්‍රියාලතා මැතිණිය සභාව අමතමින් ඇත්තටම අද රටේ තියෙන තත්වය අනුව ජනතාව පාරට බැහැලා කෑගහන්න ආණ්ඩු පෙරළන්න නෙවෙයි. මිනිසුන්ගේ ප්‍රශ්න බැරෑරුම් තත්ත්වයක පත් වෙලා තියෙනවා. ගෑස් පෝලිම ජීවිත හානි වුනා. අද තියෙන මිල නෙවෙයි හෙට පාලකයන්ට දොස් කියලා වැඩක් නෑ. ආණ්ඩුවට දොස් කියලා වැඩකුත් නැනේ. මේ ව්‍යාපාරිකයෝ තමයි අද තියෙන මිලට වැඩිය හෙට බඩු මිල වැඩි කරන්නේ. ඒ නිසා ඇත්තටම අපි අහිංසක ජනතාව වෙනුවෙන් තමයි හැම පැත්තෙන් ම තාඩන පීඩන. ගමට ගියත් කියනවා. අද හාල් මෙච්චරයි. සීනි මෙච්චරයි මිල ගණන් මිල ගණන් ගැන. අපිට ඇත්තටම සභාවක් විදිහට අපිට කිසි දෙයකුත් නෑ අපි ළඟත් නෑ මිනිස්සුන්ට සලකන්න. ඉතින් ඒ වගේ තත්ත්වයක තමයි අපි සියලු මන්ත්‍රීවරුන් මුහුණ දීලා ඇත්තේ. ඒ නිසා අපි ඔක්කොම පුළුවන් විදිහට නැති බැරි අයට යමක් දෙන්න පුළුවන් නම් එක තමයි මේ වෙලාවේ ලොකුම පරිත්‍යාගය කියලා මේ අවස්ථාවේදී පසක් කරනවා. අපි දේශපාලනය වශයෙන් තාඩන පීඩන වලට ලක් වෙලා බැනුම් අහල කට්ට කාලා ඇත්තටම. ගම්පෙරළිය නුත් කාලා කියලා කියනවා කොන්ත්‍රාත් වලිනුත් කෑවා කියලා කියනවා ඇත්තටම මම එහෙම කොන්ත්‍රාත් කරලාත් නැහැ. වැදගත් විදිහට ඉන්නේ ඕන තැනකට ගිහිල්ලා කතා කරන්න පුළුවන්. අපි ඔක්කොම ඉතිං මන්ත්‍රීවරු උනාම කොන්ත්‍රාක් ලැබෙනවා. මම හිතනවා ඉතින්

මම උනන්දුවක් නැතිකම තමයි. සමහරක් අය දුවලා පැනලා ගිහිල්ලා අරගන්නවා. රටට කවුරු හරි සේවයක් කරනවා නම් ඒ තැනට මම බාධා නොකර ඉන්නවා. යම් විදියට සාධාරනව කවුරු හරි දෙයක් කරනවා නම් ඒ තැනට මම හරි කියන තැන මම නිතර ම හිටියේ. අපි ඉදිරියේ දී ආණ්ඩුවට උද්ඝෝෂණය කරන්නේ නැතුව අපි ඔක්කොම එකතු වෙලා මේක ඉස්සරහට ගෙනියන්න අපිට ශක්තිය ලැබෙන්න කියලා අපි සභාවක් විදිහට ගහ ගන්න එපා. අපිටම තමයි මේ මුහුණු උඩ බලාගෙන කෙළ ගහ ගන්නෙ. මම එක්සත් ජාතික පාක්ෂිකයෙක් මගේ මහත්තයා නැති උනේ දේශපාලනය කරලා.

මූලාසනය සභාව අමතමින් මන්ත්‍රී තුමිය ඔබතුමියගේ මහත්තයා නැතිවුණේ ජනතා විමුක්ති පෙරමුණෙන් මොනා හරි කරලා ද.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ශ්‍රියාලතා මැතිණිය සභාව අමතමින් පක්ෂයෙන් අයින් වෙන්න කියලා ලියුම් එව්වා. නමුත් මගේ මහත්තයා පක්ෂයෙන් අයින් කරත් අයින් වෙන්නෙ නැහැ පක්ෂයෙන් මම මැරුණත් කියලා ඒ ස්ථාවරයේ හිටියා. මම එක්සත් ජාතික පක්ෂයේ පාක්ෂිකයෙක් හැකියට මම ඉටු කරනවා. ඒ උනාට මම කැමති නැහැ කුලල් කන දේශපාලයට. එක්කෙනෙක් ඉස්සරහට යද්දී අනිත් කෙනා කකුලෙන් අදිනවා. මේ විදිහට ගියොත් මේ රට හදන්න වෙන්නේ නැහැ. මම කියන්නේ ඔක්කොම එකතු වෙලා අපි මේ රට හදන්න ඕනි. ඇත්තටම දැන් ඔයා කොච්චර කෑ ගැහුවත් අවුරුදු 03 ගෙනියනවා මේ ආණ්ඩුව. අපි කාටවත් බැනලා වැඩක් නෑ අරයත් හොරකම් කරා කියලා මෙයත් හොරකම් කරා කියලා. මේ ඔක්කොම අපි මේ ජනතාව කියන්නේ අපි හොරු කියලා. ඒක නිසා මේ වගේ ඇතුලත තියෙන දේවල් සාකච්ඡා කරලා අපි ඉස්සරහට යන්න ඕනේ.

මූලාසනය සභාව අමතමින් මන්ත්‍රීතුමන්ලා දෙපල අහගන්න. ඉතා වැදගත් ඕගොල්ලන්ගේ ආචාර ධර්ම වල ප්‍රශ්නයක් තියෙනවා. ඒක තමයි මෙතුමිය කියලා දෙන්නේ මේක අහගන්න.

මූලාසනයෙන් අවසර ඉල්ලමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ශ්‍රියාලතා මැතිණිය සභාව අමතමින් 1977 මමයි මගේ මහත්තයයි දේශපාලනය කරේ. ඒ වෙනකොට මේ රටේ ආහාර හිඟයක් ඇති වුණා. එදා මඤ්ඤොක්කා අල කෑවේ. සතියට දෙසැරයයි කන්න දුන්නේ හාල් මම දන්න හැටියට. රෙදි යාර 2 ½ දෙන්නෙ ඒකත් කාඩ් එකට. ඒ කාලේ එහෙම තිබ්බ කාලයක්. 68න් පස්සේ තමයි එතකොට ඒ අය ජේ.ආර් ජනාධිපතිතුමා වෙලා මේ රටට දිවා ආහාර වේල, නිල ඇඳුම් ටික, පොත් ටික පාසල් පොත් එතකොට ඔය හැම දෙයක්ම ජන සවිය එක එක දේවල් මේ රටට එදා මනුස්සයෝ වෙනුවෙන් සහන ලබා දුන්නා. ඉතින් ඒවා අපි අමතක කරන්න ඕන නැහැ. ඒ එන අයට දොස් කියලා වැඩක් නෑ. එන එන අය යම් මොනවා හරි දෙයක් කරා රටට. අපි ඒකට කළගුණ සලකන්න ඕනේ. ඒ මනුස්සයාගේ කකුල ඇද ඇද ඒ මනුස්සයාට බැන බැන ඒක නෙමෙයි අපි මනුස්සයෝ උනාම ජීවත් වෙනකම් අපි හොඳ ගුණ ධර්මානුකූලව ජීවත් වෙන්න ඕනි. 88 වෙනකොට භීෂණයක් ආවා. ජනතා විමුක්ති පෙරමුණෙන් විරුද්ධ වුණා. එක්සත් ජාතික පාක්ෂිකයන් පක්ෂයෙන් අයින් වෙන්න කිව්වා. නැත්තම් මරනවා කිව්වා. අපේ ගෙදරටත් ලියුමක් එව්වා මච්චිම නැත්නම් මරණය කියලා. මගේ මහත්තයාගේ ගෙදරට ලියුමක් තැපැලේ එව්වා. ඒ ලැබිලා ඉවර වෙලා සති දෙකකට පස්සේ මගේ මහත්තයා රෑ නිදන් ඉන්නකොට එක්කගෙන ගිහිල්ලා ලයිට් කණුවක බැඳලා ඔලුවට වෙඩිතිබ්බා. ඒ වගේ කාලයක් 88 තිබ්බේ. දැන් අද ඒ ගොල්ලො රට හදන්න ඉල්ලනවා. ඒ වගේ නායකයො තමයි අද රට හදන්න ලෑස්ති වෙන්න. මගේ දරුවෝ පොඩි ඒ කාලේ දැන් ඉන්න අයත් දන්නෙ නෑ. ඒ මොනවද කියලා මේවා දැනගන්න ඕන ඕගොල්ලො තරුණ පරපුර ඕගොල්ල දැන ගන්න ඕනේ. 88 තිබ්බා භීෂණයත් එක්ක රටට කරපු දේවල් රෑ වෙනකොට ලයිට් නිවන්න ඕන අයිඩින්ටි කාඩ් එක එකතු කරනවා. එතකොට ඉස්කෝලවල් වලට ගිහිල්ලා රතිඤ්ඤා පත්තු කරනවා. මගේ ළමයි පොඩියි අඬාගෙන එනව බයේ. ළමයින්ට ඉස්කෝලෙ යන්න නැහැ. ඔන්න ඔය වගේ කාලයක් තමයි 88 තිබ්බේ. කොහොම කොහොම හරි ප්‍රේමදාස මහත්තයා යුගයෙන් පස්සේ යන්තම් මරණය අඩු වුණා. ඔන්න දැන් ආයි පටන් ගෙන. ළමයි ඉස්කෝලේ යන්න නැහැ. තරුණ තරුණියන් නොමඟ ගිහිල්ලා. රටට හොඳ පාලකයන් ගෙනල්ලා. එයාට මේ රට කරන්න ඉඩ දීලා පාඩුවේ ඉන්න දෙන එක තමයි ජනතාව ගෙන් ඉල්ලන්නේ. මගේ

වචන ස්වල්පයක් නිම කරනවා. ලබන්නා වූ සිංහල හින්දු අලුත් අවුරුද්ද වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තූතියි.

**මීළගට මූලාසන සභාව අමතා මූලාසනයට පිළිතුරු කතාව සභාවට ඉදිරිපත් කරන ලදී.**

මූලාසනය සභාව අමතමින් ඇත්තෙන්ම අද දවස මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ අප්‍රේල් අලුත් අවුරුද්ද ලබන අලුත් අවුරුද්දේ ඉතාමත් වැදගත් කාරණා කිහිපයක් අපේ සියලු මන්ත්‍රීවරු යෝජනා අදහස් දැක්වූවා. මම දැක්ක විදිහට ඇත්තටම විශාල ආර්ථික අර්බුදය ඒ වගේම යම් යම් දේශපාලන අර්බුදයක් සියල්ලම තියෙන අවස්ථාවක. අපේ මන්ත්‍රී කණ්ඩායමේ මම දැක්කා හොඳ දෙයක් තිබුනා 80%ම වගේ පිරිස ඇත්ත දකිනවා. ඇත්ත මොකක්ද කියන එක දකිනවා. මේ වෙලාවේ මුලින්ම අපේ ලතා මන්ත්‍රීතුමියට මම ගොඩක් ස්තුතිවන්ත වෙනවා. ඇය සංවේදීව කරපු කතාවේ විශාල දෙයක්. මට පුංචි කාලේ මතකයක් තියෙනවා. මම එදා තමයි මගේ ජීවිතේ තීන්දුක් ගත්තේ කරුණේ අයියා හින්දා. එතුමිය තවම දන්නේ නැහැ. මොකද හේතුව කරුණේ අයියා ඉතාම සුන්දර චරිතයක් මීගහකිවුලේ හිටපු. මේ මන්ත්‍රීවරු හුඟ දෙනෙක් දන්නෙ නැතුව ඇති කරුණේ අයියා අපි පුංචි කාලේ මමත් මගේ මීගහකිවුල නගරයේ තරුණයෝ ටික අපි ඉස්කෝලේ යන කාලේ අපි කරාටි පන්ති එහෙම යනවා. අපි පුහුණුවීම් කරන කොට පොලිසියේ ඇවිල්ලා අපි සෙට් එක අත්අඩංගුවට ගන්ඩ යන වෙලාවේ කරුණේ අයියා මැරෙන්න දවස් 04කට 05කට කලින් ඇවිල්ලා මේ අපේ කොල්ලෝ ටිකක් කියලා මේ ගොල්ලන් මේ සෙල්ලම් කරනවා කියලා එදා අපිව බේර ගත්තා. නැත්නම් අපිත් සමහරක් විට ඇරන් යන්ඩ ඉඩ තිබ්බා. ඉතින් ඒ වගේ කරුණේ අයියා කියන්නේ මගේ ජීවිතයේ මට තවත් අවස්ථාවක් උදව්ව කරපු කෙනෙක්. කරුණේ අයියගේ මරණ දැක්ක වෙලාවේ මට ඉතාම කණගාටු දායක අවස්ථාවක්. පුංචි කාලේ මට හිතුනා ඇත්තටම එදා තමයි මම තීරණය කළේ පොලිසියට යනවා කියලා. ඒ තරම් මම දුක් උනා කරුණේ අයියා ගැන මරණය තිබ්බ විදිහට. අශෝභන විදිහට තිරිසන් විදිහට ඒ මරණය කටයුතු කරලා තිබුණේ. කිසිම මනුෂ්‍යාත්වයක් නැති ආකාරයට. මම හිතන්නේ මේවා ගැන එතුමියගේ හදවතෙන් කතා කරපු දෙයක් ඇරෙන්ඩ මේක දේශපාලනයේ කතා කරා කියලා මම හිතන්නේ නැහැ. මේවා හදවතින් කිව්වා ඉදිරි පරපරම්පරාවටත් මේක කරන්ඩ එපා ඉදිරි දරු පරම්පරාවට කරන්න එපා අපි වෙනත් පවුල් ජීවිත විනාස කරන්න එපා. එහෙම නැත්නම් මේ වගේ අහිංසක විදිහට තිරිසන් විදිහට මිනි මරණ එපා කියන තැනට පත් කරන්න එපා කියන එක තමයි එතුමිය අපේ ගෞරවය සමාජයෙන් ඉල්ලීමක් කෙරේ. මොකද අපිටත් දැන් පේනවා එවැනි සමාජයක් ඉදිරියට නිර්මාණය වී ගෙන එනවා වගේ. එහෙම සමාජය නිර්මාණය වුනොත් මෙහෙම කතා කරන්න බැරි වේවි. ජනාධිපතිතුමා අපේ රටේ එන්නත් 03ම ගහලා මේ ඉන්න අපි ඔක්කොම මාක්ස් නැතුව ඉන්නෙ අද මෙහෙම කතා කර කර ඉන්න අද උද්ඝෝෂණය කරන්න ගෝල්ෆේස් එකට ගිහිල්ලා මේ රටේ වැඩ කරන්න හදාළ දුන්නා ජනාධිපතිතුමා එදා ඒ ගහලා දෙන එන්නත් වලින් වැඩක් වෙන්නැති වෙයි. මෙතුමිය කියන කාරණාව නැවත බිහි වුණොත් ඒ නිසා අපි පහුගිය කාලේ දේශපාලනය කතා කරේ නැහැ. අපිට හොඳට දේශපාලනය කතා කරන්න පුළුවන්. අපි දන්නවා දේශපාලනය කතා කරන්න. අපි දේශපාලන සමාජ ගත කරේ නැහැ. මම දාන වීඩියෝ එකක් ඕගොල්ලන් ශෙයා කරන්නෙ නැහැ. අපි අපේ කණ්ඩායමටත් ශෙයා කරේ නැහැ. මා හිතනවා ඒ යුගය දැන් ඇවිල්ල තියෙන්නෙ කියලා. අපි දන්නවා අපි පහුගිය මැතිවරණවලටත් ඉස්සෙල්ලා මැතිවරණය තිබුනෙ සමාජ මතය තුළින් දේශපාලනය කරන එක. හැබැයි අද තියෙන්නේ එදා තිබුණා. ළිඳ ළඟ සංගමය, පෙර පාසල් සංගමය, මරණාධාර සමිති සංගමය, කඩ පිලේ සංගමය, බාර් එකේ සංගමය තුල තමයි ජනතා මතය නිර්මාණය උනේ. හැබැයි ඒක අද කොතනකවත් නැහැ. අද නිර්මාණය වෙන්නේ සමාජ මාධ්‍ය නැත්තං ෆේස් බුක් එක හරහා what app ඒක හරහා තමයි සමාජ මත ය බිහි වෙන්නේ. අද ඕන තරම් group යනවා බයිකල් group තියෙනවා. දේශපාලන group තියෙනවා කලාකාරයින්ගෙන් group තියෙනවා. එක එක group තියෙනවා වට්ස් ඇප් හරහා බිහිවන ඒ කණ්ඩායම් තුළින් එක එක දේවල් එනවා. මං හිතන්නේ අපි දැන් කඩ මණ්ඩිය කතා කරා ඇති. දැන් පෙර පාසලේ කතා කරා ඇති. අපි දැන් ෆේස්බුක් එකට යන්න ඕන. සමාජ මාධ්‍යයට යන්න ඕනේ. අපි දැන් අලුත් ක්‍රමවේද එකට යන්න ඕනතාම. එහෙම මේ වගේ ක්‍රමවේදයක් බිහි වෙන්න විදිහක් නැහැ. මොකද හේතුව අලුත් ට්‍රෙන්ඩ් එකක් ඉන්නේ අපි හොඳටම දන්නවා කැම්පස් එකේ දරුවො ටික ඉන්නවා. ඒ වගේ තවත් තරුණ තරුණයා ටිකක් ඉන්නවා. මේ කට්ටිය 1999 2000 පස්සේ දූ දරුවෝ ඉන්නේ. ඒගොල්ලන් මේ යුද්ධය මහින්ද රාජපක්ෂ

බේරලා දුන්නා කියන එක කවුරුවත් දකින්නේ නැහැ. නායකයෙක් නැත්තං යුද්ධෙ දිනන්න බැහැ. මගේ පෝස්ට් ඔක්කොම දානවා. ඔයා ඇයි මෙහෙම කඩේ යන්නේ සමහර ඒවට. මම ඉතින් මොකුත් කියන්න යන්නේ නැහැ. මගේ දරුවෝ දන්නේ නැහැ මහින්ද මහත්තයා මේ රට කොච්චර දෙයක් කරා ද කියලා. වසර 30ක යුද්ධයක් අවසන් කරන්න කාටවත් බැරිව තිබුණේ. ඒ මහින්ද මහත්තයා තියෙන ඒ අභීත නායකයා එතුමා දේශපාලනය කරන්නේ නැති වෙයි. එතුමා අගමැතිතුමාගේලා කාටවත් කියන්න අවශ්‍යතාවයක් නැහැ එතුමා මේ රට වෙනුවෙන් කොච්චර දේවල් කරාද. යුද්ධය තියෙන කාලෙ කොච්චර දේවල් කරාද. මේ යුද්ධය අවසන් කරන්න එතුමා නායකත්වය ඕනේ නැත්තං නායකයෙක් නැතුව කොහොමද රටක් යන්නේ. ඇයි ඉස්කෝලේ පන්ති නායකයෙකු තෝර ගන්නේ ඇයි නායකත්වයක් රටක් ගෙනියන්න ලෝකයක් ගේනියන්න හැමතැනම නායකත්වයක් අවශ්‍යයි. කඩේට මුදලාලි කෙනෙක් ඉන්න ඕන නැනේ. නායකත්වය කියන එක අවශ්‍ය වෙනවා. ෆුඩ් සිටි දාන්න පුළුවන් ඕනෙම කෙනෙක්ට. හැබැයි ෆුඩ් සිටියක් පවත්වාගෙන යන්නම් බැහැ හැමෝටම. ෆුඩ් සිටියක් කෝටි ගාණක් ගානක් එකතු කරලා කරගෙන යන්න පුළුවන්. හැබැයි ඒ ෆුඩ්සිටියේ කළමනාකාරිත්වයක් නැත්නම් මොකද වෙන්නේ අවුරුද්දක් යන්න කලින් කඩා ගෙන වැටෙනවා. අන්තිමට ෆුඩ් සිටියත් නැති වෙනවා මොනවත් නැතුව ණය කාරයෙක් වෙලා හිරේ යනවා. සමාජයේ මතයක් හදන 225ම එපා කියලා. 225ම එපා නම් මේ සමාජයට ඕන තරම් අවස්ථාවක් තියෙන අවුරුදු 05කට සැරයක් මැතිවරණයක් එනවා. මුන් අයින් කරලා ඕන 225ක් දාගන්ඩ තියෙන්නේ. දැන් පහුගිය දවස් වලත් මේ රටේ ඔය මතය නිර්මාණය කරන කට්ටියම තමයි මහින්ද මහත්තයා ළඟත් හිට ගත්තේ ගෝඨාභය ජනාධිපති කරන්න හිට ගත්තොත් ඔය ටීම් එකමයි. දැන් ඔය කලාකරු අපි එකේ දකින්නේ නැතුව නෙවෙයිනේ. ඒ ගොල්ලන් කවි කිව්වා සින්දු කිව්වා ආයෙ කිව්වා බුදු හාමුදුරුවන්ගේ මේකෙන් එන්න කියලා අපේ මහින්ද මහත්තයා. දුටු ගැමුණු පරම්පරාවේ කියලා කිව්වා. ඒ කියපු කණ්ඩායමත් අද ගිහිල්ලා එහා පැත්තෙ හිටගෙන. දැන් අපි හිතමුකො අලුත් නායකයෙක් තෝරගත්ත කියලා මාස 03ක් යන්න කලින් ආයෙ මහින්ද ළඟ ඉන්නේ. අපි දේශපාලනය කරන කොට බොරු මත වල් නිර්මාණය කරන්න ඕන නැහැ. අපි හදවතට එකඟව කතා කරලා කරන්න ඕනේ ඇත්තටම මම කියන්නේ දේශපාලනයේ අපි හොරු නම් මීගහකිවුල ප්‍රාදේශී සභාවේ මන්ත්‍රීවරු හොරු කියලා පෝස්ට් කරනවා නම් එක කරන එක අපි ම වැරදි. මොකද හේතුව අපි මේකෙන් අයින් වෙන්න ඕනේ. මම හොරු සමග ඉන්න බැරි නිසා මම අයින් වුණා. මෙන්න ඉල්ලා අස් වීමේ ලිපිය. මම දානවා post හැබැයි ඔප්පු කරන්න ඕනේ හොරකම් කරලා තියනවා කියලා. මේ සභාව අපි කාටවත් කොන්ත්‍රාත් පොතක් නැහැ. කොන්ත්‍රත්කාරයෝ ඔක්කොම හොරු වෙන්න ඕනි. පාරවල් ලක්ෂයක් හැදුව මීගහකිවුල ලක්ෂ ව්‍යාපෘතියෙන් කිලෝමීටර් තිස් හයක් හැදුවා. මේ සියලු පාරවල් හැදුවා අපේ එකෙක්වත් කොන්ත්‍රාත් කරාද. එහෙනම් උන් තමයි හොරු ඇත්තටම මුන් තමයි හොරු බාගයක් පාර හදලා අපේ සල්ලි ටික අරගෙන රුහුණ කම්පැනිය පැනලා ගියා. කොමති කම්පැනිය පැනලා ගියා. උන්ට මොනවත් කියන්නේ නැහැ බෝක්කුවෙන් ගහපු සභාපති බෝක්කුවෙන් ගහපු මන්ත්‍රීවරයා කියලා කියනවා. නමුත් එයාල තමයි ගමේ මල ගෙදරක් උනාම මිනීපෙට්ටිය හරි ගෙදරට ගේන්නේ. අපි හැමදේම කරන්නේ මේ මන්ත්‍රීවරු තමයි ඒ හින්ද අපි අපිම විවේචනය කර ගන්න එපා කියන ගෞරවනීය ඉල්ලීම ඔක්කෝටම කියනවා. අපි මේ දේ කරන්නේ අපිට නැත්නම් කරන්න බැහැ අපි චමින්ද මන්ත්‍රිතුමා නැත්නම් බලෙන් හරි මගෙත් එක්ක ගේම ඉල්ලලා හරි කරපු වැඩ කීයක් නම් කරාද. අපි යූඑන්පී කාරයෙක් කියලා අතැරියා ද නැහැ. අපි ඔක්කෝටම 75000 දෙනවා. අපි එහෙම කරන්න නැහැ. මම නායකයෙක් හැටියට ගෞරවනීය විදියට හිතනවා ඔක්කොම කරනින් ගමන් ඔබතුමා නායකත්වය ගත්තේ නැත්නම් ඔබේ ගමට නළ ළිඳ වදී ද. ඔයා විපක්ෂයේ හරි ඉඳලා නායකත්වය දක්වන නිසා නේද ඒ දේවල් හම්බ වෙන්නේ. නිකම් මිනිහෙකුට දෙයිද දෙන්නෙ නැහැනේ. නායකයෙක් ඕනේ ඉල්ලලා ගන්න. හැම කෙනෙක්ම පෝලිමෙ හරක් රැලක් වගේ ගියාම මොකද වෙන්නේ මිනිස්සු හරක් නෙවෙයිනේ. එක කෙනෙක් ගිහිල්ලා මුළු ගමටම බෙදලා දෙන එක තමයි දේශපාලන නායකත්වය කියන්නේ. ඒක හොඳට තේරුම් ගත නායකයෙක් ඉන්නවා. අපේ වතුකර යෙන් බිහි වෙච්ච අපේ බාල මන්ත්‍රිතුමා. හැම දෙයක්ම නිවැරදිව තීන්දු තීරණ ගන්න පුද්ගලයෙක් කියලා අපිට කියන්න පුළුවන්. ඉතින් අපි දැක්කා ඔබතුමා හරි දේ කිව්වා. ඔහු හැමදාම අපිට කිව්වා ඔබතුමාට කාබනික පොහොර ඇත්තටම අවශ්‍ය වෙන්නෙත් නෑ වතුකරයට. නමුත් ඔබතුමා හැමදාම රසායනික පොහොර ඉල්ලුවා. ඉතින් මං හිතන්නේ ඒ රසායනික පොහොර දෙනවා කියලා ඔබතුමාම කිව්වා හරිම වටිනවා

අග්‍රාමාත්‍යතුමා කිවුවා කියලා. විශේෂයෙන් අපේ ගොවි සංවිධාන වල ගොඩක් කාලයක් කටයුතු කරපු අපේ සුමතිපාල උඩලකුඹුර මන්ත්‍රීතුමාට ඒක හරි ලොකු හොඳ අදහසක් සුන්දර වචනයක් සතුටු වෙන්න පුළුවන් වචනයක්. ඒ නිසා ඔබතුමා හැමදාම සභාවේ කෑගහපු දෙයක් මා විපක්ෂ මන්ත්‍රී කෙනෙක් වගේ කෑගැහුවා අපේ සභාවට ඇවිල්ලා පොහොර සම්බන්ධව. මං හිතන්නේ එක එල දරලා තියෙනවා. ඒකත් අපිට සතුටු දායක කාරණයක් සියලු දෙනාට ඒහෙමයි. සියලු දෙනාටම මේ කටයුතු කරගෙන යන්න හැකියාව ලැබෙනවා. අපේ චන්ද්‍රසිරි මන්ත්‍රීතුමා කිව්වා ඔබට හැකි නම් නිමල් මන්ත්‍රිතුමා දෙන්නම යෝජනා කරා. ඇත්තටම මිනිස්සු වෙනුවෙන් යමක් කරන්න ඒත් අපි තවදුරටත් වර්ධනය කරන හැදුවොත් අපිට පුළුවං පදනමක් නිර්මාණය කරොත් අපිට පුළුවන් ලබන මාසේ වෙනකොට පඩියෙන් රුපියල් පන්දාහ ගානේ දාලා පදනමක් නිර්මාණය කරොත් මං හිතනවා අපිට ඔය කියන කණ්ඩායම වෙනුවෙන් යම් දෙයක් කරන්ඩ හැකියාව වෙන්ඩත් වෙනවා තව මාස දෙකකින් අපිට උදව් කරන්න වෙනවා. මොකද අපේ රටේ දැන් තියෙන ආර්ථිකයත් එක්ක ඒ වගේම රංගන මන්ත්‍රිතුමා හොඳ කතාවකුත් කිව්වා 77න් පස්සේ තමයි අපිට මේ දවස උදා උනේ කියලා. හැබැයි සැබෑ ලෙසම එහෙම කාරණාවකුත් තිබ්බා. හැබැයි ඒ කාලේ අපි දන්නවා අපේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය අපිට යන්තම් මතකයි හාල් පෝලිම අපේම ස්වයං ව්‍යාපාර නැත්තං කෘෂිකර්මාන්ත දියුණු කරන්න කටයුතු කරපු වෙලාවේ ඒ වෙලාවේ අපේ මිනිස්සු හොඳ නෑ කියපු නිසා තමයි ඒ ජේ.ආර්.ජයවර්ධන මහතා පත් කළා. විවෘත ආර්ථික ප්‍රතිපත්තිය අපේ රට ගෙනාවේ. ඒ කාලේ අපිට තිබුණා ඇත්තටම පෝලිං තිබුණා. අපේ ලතා මන්ත්‍රීතුමිය කිව්ව වගේ කූපන් පොත තමයි අපි රෙදි ගත්තේ හාල් පෝලිමේ ඉන්න ඕනේ. බටර් ඔයිල් අපේ අම්මලා තාත්තාලා ශ්‍රමදාන වලට ගියා බටර් ඔයිල් ගන්න බටර් ඔයිල් පාම් පිටි ගන්න එහෙම තමයි ගොඩක් අමාරුවෙන් තමයි ජීවත් වුණේ. කදිරා සරම ඇන්දේ. හැබැයි ඒකෙ වැරැද්දකුත් නෑනේ. ඉතින් ඒ ටික අපි හරියට අපි කරගෙන ගියා. ඉතින් මං හිතන්නෙ ඒ වගේ කාරණා තිබිලා මේ වෙනකොට මහින්ද මහතා යුද්ධය දිනලා රට සංවර්ධනය කරලා ඉවර කරලා තියෙන්නේ. හැබැයි මේ ප්‍රශ්නෙට ඉක්මනින්ම විසඳුම් එනවා. ඇත්තටම අයි.එම්.එෆ්. ලෝන් එක ගත්තත් නොගත්තත් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාටත් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආශිර්වාදය ඕනේ වෙනවා. ඒ නිසා චීනයත් එක්ක මේ වෙන කොට සාකච්ඡා කරල හමාරයි. එසේම ඒ සියලු කරුණු කාරණාත් එක්ක රංගන මන්ත්‍රී තුමා කිව්වා වගේ තව මාස දෙකක් ඇතුළත ඔය කියන පෝලිම් නැති වෙලා නැවතත් ජනතාවට සුඛිත මුදිත ජීවිතයක් අත් වෙනවා. ඒක සියලු දෙනාම දන්නවා. ඒ වාගේම කට්ටිය කියනවා. මම නම් දකින විදියට මිනිස්සු තාම වෙනස් වෙලා නැහැ. ඔය කියන තරම් රජයක් වෙනස් කරන්න තරම් ගමේ මිනිස්සු නම් වෙනස් වෙලා නැහැ. ඒක ඔය කණ්ඩායමක් වෙනස් වෙලා කරාට. ඒ නිසා මං හිතනවා බොහොම මෑතකදී ගෝඨා අපේ මීගහකිවුලට කියලා අපි රැලියක් පවත්වනවා. ඒක නවත්තන්න බෑ. අපි අති සාර්ථකව මේ මාසයේ කරලා පෙන්නනවා. අපිට ඕන තරම් ජනතාව ගේන්න පුළුවන්. අසුචි අනු කරලා ගහනවා කියපු අය ඒ සහෝදරයා ගෙදර ඉස්සරහින් තමයි පෙළපාලියේ පටන් ගන්නේ කිසි ගැටලුවක් නෑ. ඔබතුමාල සහභාගි වෙන්න. සභාවේ කරන්න ඕනේ කතාවක් නෙවෙයි මං මේ කරේ. ලබන්නා වූ අලුත් අවුරුද්ද සුභම සුභ අලුත් අවුරුද්දක් වේවායි කියල ඔබ සියලු දෙනාටම දෙනාට මම ප්‍රාර්ථනා කරනවා. ඒ වගේ මාගේ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත් අපේ staff එකේටත් ඒ වගේම මීගහකිවුල ප්‍රදේශවාසී ජනතාවට සියලු ලෝකවාසී ජනතාවටත් සුභම සුභ අලුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ සමගම ලබන වසරේ දී ඊට වැඩිය සුභදව කටයුතු කරන්න හැකියාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් ඔබ සියලු දෙනාටම සුභම සුභ අලුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා .

සභාපති
ප්‍රාදේශිය සභාව,මීගහකිවුල

2022 ......................................................... වන දින මීගහකිවුල ප්‍රාදේශිය සභා රැස්වීම් ශාලාවේදි පවත්වන ලද මාසික මහ සභා රැස්වීමේදි ගරු ප්‍රාදේශිය සභා උප සභාපති/ගරු මන්ත්‍රී ............................................................. මැතිතුමා විසින් යෝජනා කිරිමෙන් හා ගරු ප්‍රාදේශිය සභා උප සභාපති/ගරු මන්ත්‍රී.................................................................මැතිතුමා විසින් ස්ථිර කිරිමෙන් 2022 .......................................................... දින පැවැත්වූ මාසික මහ සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බව ඒකමතිකව පිළිගන්නා ලදි.

එස්.එම්.එල්.එච්.ජයවර්ධන,
සභාපති,
ප්‍රාදේශිය සභාව, මීගහකිවුල.